පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක. 124

பாராளுமன்ற வெளியீட்டுத்தொடர் இல. 124

**Parliamentary Series No. 124**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නවවැනි පාර්ලිමේන්තුව

(සිව්වැනි සභාවාරය)

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் ஒன்பதாவது பாராளுமன்றம்

(நான்காவது கூட்டத்தொடர்)

The Ninth Parliament of the Democratic Socialist Republic of Sri Lanka
(Fourth Session)

# ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ පළමු වාර්තාව

# வழிவகைகள் பற்றிய குழுவின் முதலாவது அறிக்கை

# First Report of the Committee on Ways and Means

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නවවැනි පාර්ලිමේන්තුව**

**(සිව්වැනි සභාවාරය)**

# ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ පළමු වාර්තාව

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ සභාපති

**ගරු පාඨලී චම්පික රණවක මහතා**

විසින්

2023 සැප්තැම්බර් මස 6 වැනි දින

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් 2023 සැප්තැම්බර් මස 6 වැනි දින මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

## ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව - සාමාජික මන්ත්‍රීවරුන්

1. ගරු පාඨලී චම්පික රණවක මහතා (සභාපති)
2. ගරු රංජිත් සියඹලාපිටිය මහතා
3. ගරු ලසන්ත අලගියවන්න මහතා
4. ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා
5. ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
6. ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා
7. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
8. ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා
9. ගරු වාසුදේව නානායක්කාර මහතා
10. ගරු අශෝක් අබේසිංහ මහතා
11. ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
12. ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
13. ගරු ඉෂාක් රහුමාන් මහතා
14. ගරු හේෂා විතානගේ මහතා
15. ගරු සංජීව එදිරිමාන්න මහතා
16. ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
17. ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

## කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය

1. බුද්ධිකා අබේසිංහ මෙය - කාරක සභාවේ ලේකම්
2. ඉසුරි සරත්චන්ද්‍ර මෙය - සහකාර ප්‍රධාන නිලධාරි

# කාරක සභා වාර්තා

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කර ගැනීමට හැක.

භාෂාව තෝරන්න

↓

ප්‍රකාශන

↓

කාරක සභා වාර්තා

↓

ව්‍යවස්ථාදායකය තෝරන්න (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නවවැනි පාර්ලිමේන්තුව)

↓

සභාවාරය (4)

↓

කාරක සභා වර්ගය (විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා)

↓

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව

↓

වාර්තාව තෝරන්න

# පටුන


| | පිටු අංක |
|---|---|
| 1. පසුබිම …………………………………….. | 1 - 2 |
| 2. හැඳින්වීම …………………………………….. | 3 - 4 |
| 3. කැඳවන ලද ආයතන ………………………………… | 5 |
| 4. පවත්වන ලද කාරක සභා රැස්වීම් ……………….. | 6 - 10 |
| 5. කාරක සභාව ආයතන වෙත ගොස් නිරීක්ෂණය කිරීම … | 11 - 12 |
| 6. සාධාරණ බදුකරණයේ මූලධර්ම ……………….. | 13 - 18 |
| 7. රජයේ ආදායම ……………………………………... | 19 - 20 |
| 8. ශ්‍රී ලංකා රේගුව | |
| ➢ පසුබිම ……………………………………… | 21 - 22 |
| ➢ නිරීක්ෂණ ………………………………… | 23 - 25 |
| ➢ නිර්දේශ ………………………………… | 26 - 29 |
| 9. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | |
| ➢ පසුබිම ……………………………………… | 30 - 31 |
| ➢ නිරීක්ෂණ ………………………………….. | 32 - 35 |
| ➢ නිර්දේශ ………………………………….. | 36 - 40 |
| 10. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | |
| ➢ පසුබිම ……………………………………… | 41 - 42 |
| ➢ නිරීක්ෂණ ………………………………… | 43 - 46 |
| ➢ නිර්දේශ ………………………………… | 47 - 49 |
| 11. ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතිය | |
| ➢ පසුබිම ……………………………………… | 50 |
| ➢ නිරීක්ෂණ ………………………………… | 51 |
| ➢ නිර්දේශ ………………………………… | 52 |
| 12. සමාජ සේවා වැඩසටහන් සහ සමාජ ආරක්ෂණ ජාලය | |
| ➢ පසුබිම ……………………………………... | 53 |
| ➢ නිරීක්ෂණ ………………………………… | 54 - 56 |
| ➢ නිර්දේශ ………………………………… | 57 - 58 |
| 13. හදිසි ආපදා සහන | |
| ➢ පසුබිම ……………………………………… | 59 - 60 |
| ➢ නිරීක්ෂණ ………………………………… | 61 |
| ➢ නිර්දේශ ………………………………… | 62 |

14. ඇමුණුම් I - පාර්ලිමේන්තු ස්ථාවර නියෝග
අංක 124 ………………………..v - vii
II - ශ්‍රී ලංකා රේගුව විසින්
ඉදිරිපත් කර ඇති
හිඟ බදු සම්බන්ධ වාර්තාව …………… xv - xvii
III - දේශීය ආදායම්
දෙපාර්තමේන්තුවේ LEGACY යටතේ
2023.06.30 දිනට
එකතු කළ හැකි
හිඟ බදු සම්බන්ධ වාර්තාව …..………. xviii - xxii
IV - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ
2022.12.31 දිනට
හිඟ බදු සම්බන්ධ වාර්තාව …………… xxiii
V - ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ
හිඟ බදු සම්බන්ධ වාර්තාව …………… xxiv

# පසුබිම

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව, විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභාවක් ලෙස පිහිටුවන ලද්දේ 2022 නොවැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සංශෝධනය කිරීමෙනි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 124 ප්‍රකාරව ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 16 දෙනකුගෙන් සමන්විත වෙයි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 124 හි කුමක් සඳහන්ව තිබුණද, නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය තුළ සේවය කරනු පිණිස තේරීම් කාරක සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින් දහහත් (17) දෙනකුගෙන් ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව සමන්විත විය යුතු බවට 2023 පෙබරවාරි 10 වැනි දින පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් සම්මත කරන ලදී. තේරීම් කාරක සභාවේ නාමයෝජනය පරිදි 2023 පෙබරවාරි 21 වැනි දින ගරු කථානායකතුමා විසින් ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ සාමාජිකයින්ගේ නම් පාර්ලිමේන්තුව විසින් නිවේදනය කරනු ලැබූ අතර ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා එම කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව පුරවනු පිණිස කාරක සභාවෙහි සේවය කිරීම සඳහා ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතාගේ නම කථානායකතුමා විසින් 2023 අප්‍රේල් මස 25 වැනි දින නිවේදනය කරන ලදී.

ස්ථාවර නියෝග අංක 124 ප්‍රකාරව ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවට පහත සඳහන් බලතල ඇත.

- රජයේ ප්‍රධාන ආදායම් උත්පාදන ආයතන වන ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් උපයනු ලබන ආදායම් වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග
- බදුකරණය හා තීරුබදු සම්බන්ධ සියලු කාරණා සහ බදුකරණය හා තීරු බදු ගාස්තු සම්බන්ධ පවත්නා ප්‍රතිපත්තිවලට වෙනස්කම් යෝජනා කිරීම
- අන්තර්ජාතික වෙළඳාම ආශ්‍රිත කරුණු
- අපනයන ප්‍රතිපත්ති ඇතුළු වෙළඳ කර්මාන්ත ආශ්‍රිත කරුණු
- රජයේ සමාජ සුභසාධන වැඩසටහන් ආශ්‍රිත කරුණු
- හදිසි ආපදා සහන ලබා දීම ආශ්‍රිත කරුණු

පිළිබඳව විමර්ශනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම

රටේ මූල්‍ය කාරණා පිළිබඳව අධීක්ෂණය කරන කාරක සභාවක් ලෙස ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවට එම කාරක සභාවේ විෂය පථය ඇතුළත පොදු අධීක්ෂණ බලතල පවත්නා අතරම, පවත්නා නීති රීතිවලට සීමා වන නමුදු මෙම කාරක සභාවට සිය විෂය පථය ඇතුළතට ගැනෙන කාරණා සම්බන්ධයෙන් නව නීති පැනවීම, පවත්නා නීතිවලට සංශෝධන හඳුන්වා දීම හෝ පවතින නීති පරිච්ඡින්න කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.

2023 මාර්තු මස 23 වැනි දින පවත්වන ලද කාරක සභාවේ පළමු රැස්වීමේදී ගරු පාඨලී චම්පික රණවක මහතා මෙම කාරක සභාවේ සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගනු ලැබීය.

# හැඳින්වීම

රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය, ආර්ථික තරඟකාරීත්වය, රාජ්‍ය ආයතනවල මනා ක්‍රියාකාරීත්වය සහ මෙම සියලුම අංශ විනිවිදින ආර්ථිකය යහපාලනය රටක ආර්ථිකයේ යහපැවැත්ම සහ දිශානතිය තීරණය කරන වැදගත් සාධක වෙයි. මෙම සාධක ඉදිරියේදී හෝ කළමනාකරණය කර ගැනීම රට බංකොලොත්භාවයෙන් මුදා ගැනීමට සහ තිරසාර ආර්ථික වර්ධනයක් සහ තිරසාර සංවර්ධනයක් කරා රට රැගෙන යාමට ඉවහල් වනු ඇත.

1. රාජ්‍ය ආදායම

ප්‍රමාණවත් රාජ්‍ය ආදායමක් රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වයේ මූලික පදනමයි. එමෙන්ම රජයේ වියදම කළමනාකරණය කර ගැනීමට සහ සංවර්ධන කටයුතුවලට ප්‍රමාණවත් වන ලෙස අවශ්‍ය සම්පත් සම්පාදනයට රජය අපොහොසත් වීම දිගුකාලීනව රාජ්‍ය බංකොලොත්භාවයට පත් වීමට මඟ පාදයි. 2022 වසරේදී ශ්‍රී ලංකා රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 8.2% ක පහළ මට්ටමකට වැටී තිබුණි. (ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2022) මීට දශක තුනකට පෙරදී මෙම මට්ටම අඛණ්ඩව 20% සීමාව පසු කර තිබුණි. 2022 වසරේදී ශ්‍රී ලංකා රජයේ ආදායම ගෝලීය වශයෙන් ද අවම අගයක් වූ අතර රටවල් එකසිය අනූ තුනක් (193) අතරින් අපට හිමි වූයේ එකසිය අනූව (190) වැනි ස්ථානයයි.

රාජ්‍ය ආදායම, බදු (ඍජු සහ වක්‍ර) සහ බදු නොවන ආදායම්වලින් සමන්විත වේ. ඛනිජ තෙල් සහ ගෑස් වැනි ස්වභාවික සම්පත් නොමැති ශ්‍රී ලංකාව වැනි රටවලට වඩා වැදගත් වන්නේ බදු ආදායමයි. බදු අය කර ගැනීමේ ප්‍රතිපත්ති ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මූලධර්ම සහ ප්‍රමිතීන්වලට එනම් සාධාරණත්වය නැතහොත් ගෙවීමට ඇති හැකියාව මත බදු පැනවීම, අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය, නිශ්චිතබව සහ සරලබව යන කරුණුවලට අනුකූල විය යුතුය. වක්‍ර බදු බර ක්‍රමයෙන් අඩු කර ගනිමින් ඇති හැකි අයගෙන් බදු වැඩිපුර අය කර ගැනීමත්, බදු නිසා ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට සිදුවන බලපෑම අවම කර ගැනීමත් අපගේ ප්‍රතිපත්තිය විය යුතුය. එමෙන්ම බදු ගෙවන්නාට බදු ගෙවීමට ගතවන කාලය සහ ශ්‍රමය අවම කර ගැනීම, නව තාක්ෂණය හරහා රාජ්‍ය ආයතන සහ බැංකු සමඟ දත්ත හුවමාරු කරගැනීම, බදු විගණන කටයුතු ශක්තිමත් කිරීම, නාස්තිය සහ දූෂණය අවම වන ලෙස බදු කාර්ය පටිපාටි සැලසුම් කිරීම, බදු පරිපාලනය කාර්යක්ෂම කිරීමට අත්‍යවශ්‍ය කරුණු වේ. මෙම කරුණු ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ විෂය පථයට ඍජුවම අදාළ වේ.

2. ආර්ථිකයේ තරඟකාරිත්වය නගා සිටුවීම

අපගේ භාණ්ඩ හා සේවාවලට ලෝකයේ අනෙකුත් රටවල් සමඟ තරඟකර විදේශ විනිමය උපයා ගත නොහැකි නම් අපට තරඟකාරීව භාණ්ඩ හා සේවා ආනයනය කිරීමට අවකාශය නොලැබෙනු ඇත. අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන්

ලෝක වෙළඳපොළ කෙරෙහි ඇති යැපීම අවම කර ගනිමින් ප්‍රධාන වශයෙන් ආනයන ආදේශන ආර්ථිකයක් කරා ගමන් කිරීම වෙනුවට අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ අපගේ පංගුව වැඩි කර ගැනීම අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධ මූලික ඉලක්කය විය යුතුව ඇත.

අපට සාපේක්ෂව වාසි ඇති නිෂ්පාදනවලට සම්පත් යොමු කරමින්, නවෝත්පාදන හරහා ඉදිරි පිම්මක් ගැනීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම තුළින් විදේශ විනිමය ඉපයීම් ඉහළ දැමීම අපගේ ප්‍රතිපත්තිය විය යුතුය. ඒ සඳහා අපනයනාභිමුඛ ඵලදායි විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම මෙන්ම දේශීය පුද්ගලික ආයෝජන දිරිගැන්වීම අවශ්‍ය වේ. සාර්ව ආර්ථික ස්ථායිතාවය ළඟාකර ගැනීම සහ පවත්වාගෙන යාම, භෞතික ප්‍රාග්ධනයට වඩා මානව ප්‍රාග්ධනය වර්ධනයට සීමිත සම්පත් යෙදවීම, ආයෝජන පරිසරයට අදාල බාධා අවම කිරීම සහ තාක්ෂණය මුල්කරගත් ව්‍යවසායකත්වය ප්‍රවර්ධනයට අතහිත දීම අප විසින් සිදුකළ යුතුය. එයට අනුකූල වන ලෙස අපගේ තීරු බදු හා වෙළඳ ප්‍රතිපත්තීන් මෙන්ම විදේශ රටවල් සමඟ ඇතිකර ගන්නා වෙළඳ ගිවිසුම් ආදිය ද සලකා බැලිය යුතුය.

3. ආපදා කළමනාකරණය

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් සලකා බැලූ තවත් ක්ෂේත්‍රයක් වූයේ ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයයි. මානව ක්‍රියාකාරකම් මෙන්ම දේශගුණික විපර්යාස වැනි ගෝලීය ක්‍රියාවන් නිසා ද ස්වභාවික ආපදාවන් වර්ධනය වීමේ ප්‍රවණතාවක් ඇත. මේ තත්ත්වයන්ට මුහුණ දීමට සුදුසු විධිමත් අන්තර් ආයතනික සංවිධානයක් අත්‍යවශ්‍ය වේ. එමෙන්ම ගෝලීය වශයෙන් පවතින හරිත හා තිරසර සංවර්ධන මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා විධිමත් නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුවක් ද අවශ්‍ය වේ.

4. සමාජ සේවා වැඩසටහන්

ඉලක්කගත සමාජ කණ්ඩායම් හඳුනාගත්, දේශපාලන හිතවත්කම්වලින් අත්මිදුණු සමාජ ආරක්ෂණ ක්‍රියාදාමයක් රටට අත්‍යවශ්‍යව ඇත. විශේෂයෙන්ම මූල්‍ය අර්බුදය විසින් ඇති කර ඇති නව දුගී පන්තිය, විරැකියාවෙන් පෙළෙන සමාජ තීරු, බිඳ වැටෙමින් ඇති සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍ර පිළිබඳ ඍජු මැදිහත්වීමක් අවශ්‍ය බැව් පෙනී යයි.

## කැඳවන ලද ආයතන
## (2023.03.23 සිට 2023.08.22 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ)

- මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා රේගුව
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
- කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය
- සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය
- සමාජ ආරක්ෂණ මණ්ඩලය
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
- සමාජ සේවා දෙපාර්තමේන්තුව
- ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය
- වැඩිහිටි තැනැත්තන් සඳහා වන මහලේකම් කාර්යාලය
- ආරක්ෂක අමාත්‍යාංශය
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)

# පවත්වන ලද කාරක සභා රැස්වීම්

- **කාරක සභාවේ පළමුවැනි රැස්වීම – 2023.03.23**

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව සඳහා සභාපතිවරයෙකු පත් කර ගැනීමේ අරමුණින් 2023 මාර්තු 23 වන දින එහි පළමුවැනි කාරක සභා රැස්වීම පැවැත්විණි. ඒ අනුව, ගරු ලසන්ත අලගියවන්න මහතාගේ යෝජනාවෙන් සහ ගරු සංජීව එදිරිමාන්න මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු පාඨලී චම්පික රණවක මහතා කාරක සභා සභාපතිවරයා ලෙස කාරක සභාව විසින් ඒකමතිකව තෝරා පත් කර ගන්නා ලදී.

මෙම රැස්වීමේදී පහත දැක්වෙන කරුණු සාකච්ඡා කරන ලදී.

- මෙම කාරක සභාවෙහි නම සිංහල භාෂාවෙන් "ක්‍රම සහ විධි" යන්න යෝග්‍ය නොවන බැවින් පාර්ලිමේන්තුව විසින් මෙම කාරක සභාවට ලබා දුන් බලාධිකාරය නිසි පරිදි පිළිබිඹු කිරීම සඳහා එහි සිංහල නම සංශෝධනය කළ හැකි ආකාරය පිළිබඳව සොයා බලන මෙන් කාරක සභාව විසින් එහි ලේකම්වරියගෙන් ඉල්ලා සිටින ලදී.

- පාර්ලිමේන්තුව තුළ මූල්‍යමය කාරණා අධීක්ෂණය කරනු ලබන කාරක සභා වශයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, බැංකුකරණය හා මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව, ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව සහ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව යන සියලු කාරක සභාවන්හි සාකච්ඡාවට භාජනය වන එකිනෙක ගැටෙන සමාන විෂය පථයන් පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කෙරිණි.

- **කාරක සභාවේ දෙවැනි රැස්වීම – 2023.04.26**

බදුකරණය, තීරු ගාස්තු සහ රජය විසින් ගනු ලබන වෙනත් ආදායම් උත්පාදන ක්‍රියාමාර්ග සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීමට 2023 අප්‍රේල් මස 26 වන දින පැවැත්වූ කාරක සභාවේ දෙවැනි රැස්වීම සඳහා රජයේ ප්‍රධානතම ආදායම් උත්පාදන ආයතන වන ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතන කැඳවන ලදී. ඒ අනුව, මෙහිදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යෝජනා කර ඇති ඉලක්ක අත්කර ගැනීම සඳහා හා 2023 අයවැය මගින් අපේක්ෂිත රාජ්‍ය ආදායම රැස් කරගැනීමට මෙම ආයතන සතු වැඩපිළිවෙළ සම්බන්ධ පරිගණක ඉදිරිපත් කිරීම් (powerpoint presentations) සිදු කරන ලෙස මෙම ආයතන වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී මෙම කාරක සභාවේ නාමය "මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ කාරක සභාව" ලෙස එහි සිංහල පරිවර්තනය සංශෝධනය විය යුතු බවට කාරක සභාව යෝජනා කළ අතර ඒ අනුව අදාළ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරක සභාව විසින් එහි ලේකම්වරියට නියෝග කරන ලදී.

- **කාරක සභාවේ තෙවැනි රැස්වීම – 2023.05.10**

2023.04.26 දින පැවැත්වූ කාරක සභාවේ දෙවැනි රැස්වීම් වාරයෙහිදී ලබා දුන් නියෝග ප්‍රකාරව එක් එක් ආයතන විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳ සාකච්ඡා කිරීමට 2023 මැයි මස 10 වන දින පැවැත්වූ තෙවැනි රැස්වීම් වාරයේ පළමු සැසිවාරය සඳහා ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සහ මුදල්, ආර්ථික ස්ථායීකරණය හා ජාතික ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යාංශය කාරක සභාව වෙත කැඳවන ලදී.

එමෙන්ම, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමාජ ආරක්ෂණ වැඩසටහන් හා සමාජ ආරක්ෂණ ජාලය පිළිබඳ සාකච්ඡා කිරීමට එහි දෙවැනි සැසිවාරය සඳහා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 124 (3) (උ) ප්‍රකාරව කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් පිළිබඳ අමාත්‍යාංශය, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, සමාජ ආරක්ෂණ මණ්ඩලය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය සහ වැඩිහිටි තැනැත්තන් සඳහා වන මහලේකම් කාර්යාලය යන ආයතන කාරක සභාව හමුවට කැඳවන ලදී.

- **කාරක සභාවේ සිව්වැනි රැස්වීම – 2023.05.24**

හදිසි සහන සැපයීම සහ ඒ සම්බන්ධ ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 124 (3) (ඌ) ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය යන ආයතන 2023 මැයි මස 24 වන දින පැවති කාරක සභාවේ සිව්වැනි රැස්වීම සඳහා කැඳවන ලදී.

- **කාරක සභාවේ පස්වැනි රැස්වීම – 2023.06.07**

ආනයන අපනයන, ඇඟළුම්, තේ කර්මාන්ත, නාවික සහ තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයන් කෙරෙහි නව බදු පැනවීම් සහ අනෙකුත් කාරණා හේතුවෙන් ඇති වී තිබෙන බලපෑම සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ඇඟළුම්, තේ කර්මාන්ත, තොරතුරු තාක්ෂණ, ආනයන අපනයන හා නාවික යන ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක වන වෙළඳ සංගම් 2023 ජූනි මස 07 වන දින පැවැත්වූ කාරක සභා රැස්වීම සඳහා කැඳවන ලදී.

ඒ අතරම, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124 (10) ප්‍රකාරව ප්‍රධාන ආදායම් උත්පාදන ආයතන ත්‍රිත්වයෙහි ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා එම ආයතන වෙත නිරීක්ෂණ චාරිකාවන් සිදු කිරීමට කාරක සභාව මෙහිදී තීරණය කරන ලදී.

- **කාරක සභාවේ සයවැනි රැස්වීම –2023.06.21**

ප්‍රධාන ආදායම් උත්පාදන ආයතන ත්‍රිත්වය සහ ඒ සම්බන්ධ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා ඒකාබද්ධ ඩිජිටල් වේදිකාවක් සකස් කිරීමේදී මුහුණ දීමට සිදුවන අභියෝග සඳහා විසඳුම් සෙවීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ විශේෂඥයින් වන තොරතුරු හා

සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති මහාචාර්ය මලික් රණසිංහ මහතා, චන්දන රණසිංහ මහතා සහ ජනක රූපසිංහ මහතා සමඟ 2023 ජූනි මස 21 වන දින උපදේශන සාකච්ඡාවක් පැවැත්විණ.

ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) තුළ පවතින තාක්ෂණික සහ මෙහෙයුම් ගැටළු පිළිබඳ මෙහිදී සාකච්ඡා කරන ලදී.

- **කාරක සභාවේ සත්වැනි රැස්වීම –2023.07.19**

ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය, 2.0 වෙත යාවත්කාලීන කිරීමේදී හා රාජ්‍ය ආයතන 13ක් හා මෙම පද්ධතිය ඒකාබද්ධ කිරීමේදී ඇතිවන ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මෙම රැස්වීම කැඳවන ලද අතර ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) නියෝජිතයෝ, දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීහු සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම්වරියක් ද මෙම රැස්වීම සඳහා සහභාගී වූහ.

මෙහිදී 2024 ජනවාරි මාසය වන විට ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය 2.0 පවරා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සූදානම සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර මෙම කාර්යය භාර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා විශේෂඥභාවය සහිත නිලධාරීන්ගේ හිඟය පිළිබඳව ද අවධාරණය කෙරිණි.

- **කාරක සභාවේ අටවැනි රැස්වීම - 2023.07.31**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන වෘත්තීය සංගම් සහ වෘත්තීය සංවිධාන සමඟ එම දෙපාර්තමේන්තුවේ සේවකයන් මුහුණපාන ගැටළු සාකච්ඡා කිරීම සඳහා 2023.07.31 වන දින මෙම රැස්වීම කැඳවන ලදී.

ඒ අනුව, දේශීය ආදායම් කොමසාරිස්වරුන්ගේ සංගමය, දේශීය ආදායම් තක්සේරු නිලධාරීන්ගේ සංගමය, දේශීය ආදායම් සේවා සංගමය, දේශීය ආදායම් පොදු සේවක සංගමය, දේශීය ආදායම් විධායක නිලධාරී සංගමය සහ දේශීය ආදායම් මාණ්ඩලික නිලධාරීන්ගේ සංගමය නියෝජනය කරන නියෝජිතයෝ සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අංශයේ නිලධාරීහු මෙම රැස්වීම සඳහා සහභාගි වූහ.

- **කාරක සභාවේ නවවැනි රැස්වීම - 2023.08.08**

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124 (3) (උ) මඟින් කාරක සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ආබාධිත ප්‍රජාව මුහුණපාන ගැටළු සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා ආබාධිත සම්මේලනය නියෝජනය කරනු ලබන පුද්ගලයින් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් මෙම රැස්වීම සඳහා කැඳවා තිබුණි.

මෙහිදී, දෘශ්‍යාබාධිත පුද්ගලයින් බැංකු ගිණුම් ආරම්භ කිරීමේදී මුහුණපාන ගැටළු සඳහා විසඳුම් සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවද, දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ නොලැබීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය සහ ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත සම්මේලනය පිහිටි ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා කොළඹ මහ නගර සභාව නියෝජනය කරමින් නිලධාරීහු මේ සඳහා සහභාගි වූහ.

- **කාරක සභාවේ දසවැනි රැස්වීම - 2023.08.10**

මත්පැන් බෝතල්වල ව්‍යාජ ආරක්ෂිත මුද්‍රාව (Fake security stamp) හඳුනා ගැනීම නිරීක්ෂණය කිරීම සඳහා සහ ව්‍යාජ ආරක්ෂිත මුද්‍රාව සහිත මත්පැන් බෝතල් වෙළඳපොළ තුල සංසරණය වළක්වා ගැනීමට ඇති පිළියම් පිළබඳ සාකච්ඡා කිරීම සඳහා 2023.08.10 වන දින කාරක සභාවේ රැස්වීමක් කැඳවා තිබුණි.

මෙම රැස්වීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීහු, මැඩිරාස් ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගමේ මෙරට නියෝජිත සහ ව්‍යාජ ආරක්ෂිත මුද්‍රාව හඳුනාගැනීම සඳහා උපාංගයක් නිර්මාණය කර ඇති පුද්ගලයෙක් ස්වෙච්ඡාවෙන් මෙම රැස්වීම සඳහා සහභාගි වූහ.

- **කාරක සභාවේ එකොළොස්වැනි රැස්වීම - 2023.08.15**

"අස්වැසුම" ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දිවයින තුළ ක්‍රියාත්මක වන ග්‍රාම නිලධාරින්ගේ වෘත්තීය සංගම් සහ වෘත්තීය සංවිධාන 2023.08.15 දින පැවති කාරක සභා රැස්වීමට කැඳවා තිබුණි.

ශ්‍රී ලංකා එක්සත් ග්‍රාම නිලධාරි සංගමය, සමස්ත ලංකා නිදහස් ග්‍රාම නිලධාරි සංගමය, ශ්‍රී ලංකා ප්‍රගතිශීලී ග්‍රාම නිලධාරි සංගමය, ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සංගමය, උපාධිධාරි ග්‍රාම නිලධාරි සංගමය, රජයේ ග්‍රාම නිලධාරින්ගේ සංගමය, ශ්‍රී ලංකා පරිපාලන ග්‍රාම නිලධාරින්ගේ සංගමය, සමස්ත ලංකා පරිපාලන ග්‍රාම නිලධාරින්ගේ සංගමය සහ ශ්‍රී ලංකා එක්සත් ගම්පත ග්‍රාම නිලධාරි සංගමය නියෝජනය කරන ග්‍රාම නිලධාරීන් මෙම රැස්වීම සඳහා සහභාගි වූහ.

එමෙන්ම, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුව, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය නියෝජනය කරන නිලධාරීහු සහ කොළඹ දිස්ත්‍රික් ලේකම්, කොළඹ ප්‍රාදේශීය ලේකම්, කලුතර ප්‍රාදේශීය ලේකම් සහ බේරුවල ප්‍රාදේශීය ලේකම් මෙම රැස්වීම සඳහා සහභාගි වූහ.

- **කාරක සභාවේ දොළොස්වන රැස්වීම - 2023.08.22**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සුරාබදු සහ දුම්කොළ බදු ලෙස උපයනු ලබන රජයේ ආදායම අහිමි වී යාමට බලපාන විවිධ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2023 අගෝස්තු මස 22 වන දින කාරක සභාවේ රැස්වීමක් පැවැත්විණ.

මෙම රැස්වීමේදී රා සඳහා ප්‍රමිතීන් හඳුන්වා දීමේ අවශ්‍යතාවය හා ස්වභාවික රා වලින් කෘතිම රා වෙන්කර හඳුනා ගැනීමේ ක්‍රමවේද හඳුන්වා දීම, මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම නියාමනය කිරීම හා රජයේ ආදායම අහිමි වීමට හේතු වන ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේද හා එම තත්ත්වයන් නිවැරදි කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කෙරිණ.

## කාරක සභාව විසින් ආයතන වෙත ගොස් නිරීක්ෂණය කිරීම

කාරක සභාව විසින් පහත සඳහන් ආයතනවල කාර්යයන් නිරීක්ෂණය කිරීම සඳහා එම ආයතන වෙත ගොස් නිරීක්ෂණය කරන ලදී:

### ශ්‍රී ලංකා රේගුව වෙත සිදු කරන ලද නිරීක්ෂණ චාරිකාව - 2023.06.23

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 124(10) යටතේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ කාර්යයන් ඉටුකිරීම සඳහා දේපල සහ ගබඩා වෙත ප්‍රවේශ වීමට කාරක සභාවට පැවරී ඇති බලය ප්‍රකාරව 2023 ජූනි මස 23 වැනි දින ශ්‍රී ලංකා රේගුවේ රේගු මූලස්ථානය, බහාලුම් පරිලෝකනය කිරීමේ අංශය සහ බහාලුම් පරීක්ෂා කිරීමේ අංගනය ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන්ගේ නිරීක්ෂණයට ලක් විය.

ශ්‍රී ලංකා රේගු මූලස්ථානයේදී රේගු නිලධාරීන් විසින් කාරක සභාවේ සාමාජිකයින් වෙත රේගු ආනයන අපනයන නිෂ්කාශන ක්‍රියා පටිපාටි පිළිබඳව පැහැදිලි කරන ලදී.

ඉන් අනතුරුව, ASYCUDA පද්ධතියේ ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීම සඳහා කාරක සභාවේ සාමාජිකයෝ ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය (ICT Directorate) සහ ලේඛන අනුමත කිරීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රකාශන අංශය (Declarations Directorate) වෙත ගියහ.

ඉන්පසු, කාරක සභාවේ සාමාජිකයෝ බහාලුම් පරිලෝකනය කිරීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේ අරමුණින් කොළඹ වරාය තුළ පිහිටා ඇති බහාලුම් පරිලෝකනය කිරීමේ අංශය (Rapiscan) වෙත සහ ආනයන බහාලුම් පරීක්ෂණ ක්‍රියාවලිය සහ තක්සේරු ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා ඕරුගොඩවත්තේ පිහිටි බහාලුම් පරීක්ෂා කිරීමේ අංගනය වෙත ගියහ.

### දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සිදු කරන ලද නිරීක්ෂණ චාරිකාව - 2023.07.13

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෝ 2023 ජූලි 13 වැනි දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූහ. රටේ බදු ආදායම කාර්යක්ෂමව එකතු කිරීම මඟින් රජයේ ආදායම ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර සම්බන්ධයෙන් කාරක සභාවේ සාමාජිකයෝ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා කළහ.

කාරක සභාවේ සාමාජිකයින් විසින් දෙපාර්තමේන්තුවේ බදු ගෙවන්නන්ගේ සේවා ඒකකය, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සහ තොරතුරු තාක්ෂණ පරිපාලන සේවා ඒකකය (ITAS) හි කාර්යයන් නිරීක්ෂණය කරන ලදී.

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත සිදු කරන ලද නිරීක්ෂණ චාරිකාව - 2023.07.24

2023 ජූලි 24 වන දින, ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෝ රාජගිරියේ පිහිටි ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට පැමිණියහ. සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කාරක සභාවේ සාමාජිකයෝ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කළහ.

ජංගම යෙදුම භාවිතා කර ව්‍යාජ ආරක්ෂිත මුද්‍රා හඳුනා ගත හැකිද යන්න පිළිබඳව, මානව සම්පත් අංශයේ කාර්යයන් හා සුරාබදු නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා ආදායම් ඉලක්ක අත්පත් කර ගැනීමේ ප්‍රගතිය ඇගයීම සඳහා යොදා ගනු ලබන අභ්‍යන්තර ඇගයීමේ ක්‍රමවේදය කාරක සභාවේ සාමාජිකයෝ නිරීක්ෂණය කළහ.

කාරක සභාවේ සාමාජිකයින් විසින් සැපයුම් දාම නියාමන අංශයේ සහ ආදායම් මෙහෙයුම් හා බලපත්‍ර අංශයේ කාර්යයන්ද නිරීක්ෂණය කරන ලදී.

## සාධාරණ බදුකරණයේ මූලධර්ම

යහපත් බදු ප්‍රතිපත්තියක ඇති මූලධර්ම මොනවාද සහ ඒවා ජනතාවගේ දෛනික ජීවිතයට මෙන්ම ආර්ථික කටයුතුවලට කෙතරම් දුරට බලපාන්නේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත්ය. බදු යනු රජයක ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන අතර පොදු අධිකාරියක බලතල පිළිබඳ පැහැදිලිතම ප්‍රකාශනයක් ද වේ.

අතීතයේ සිට ක්‍රමක්‍රමයෙන් විකාශනය වූ බදු මූලධර්ම දැන් සංකීර්ණ මට්ටමකට පැමිණ ඇත. යහපත් බදුකරණයේ මූලධර්ම මීට වසර ගණනාවකට පෙර සකස් කරන ලදී. බදුකරණය විසින් සාධාරණත්වය, නිශ්චිතභාවය, පහසුව සහ කාර්යක්ෂමතාව යන මූලධර්ම හතර අනුගමනය කළ යුතු බව "ජාතීන්ගේ ධනය" (The Wealth of Nations 1776) නම් ග්‍රන්ථයේ ඇඩම්ස් ස්මිත් මහතා විසින් සඳහන් කොට ඇත.

- සාධාරණත්වය: බදු අය කිරීම, බදු ගෙවන්නන්ගේ පුද්ගලික සහ පවුලේ අවශ්‍යතාවලට අනුව ගෙවීමට ඇති හැකියාව ඇතුළුව බදු ගෙවන්නන්ගේ තත්ත්වය සමඟ අනුකූල විය යුතුය.

- නිශ්චිතභාවය: බදු අය කරන්නේ මන්ද සහ කෙසේද යන්න පිළිබඳව බදු ගෙවන්නන් දැනුවත් කළ යුතුය.

- පහසුව: එය බදු ගෙවන්නන් සඳහා අනුගතවීමේ පහසුව හා සම්බන්ධිතය. බදු එකතු කිරීමේ හෝ ගෙවීමේ ක්‍රියාවලිය සරල විය යුතුය.

- කාර්යක්ෂමතාව: බදු එකතු කිරීමේ පරිපාලනය ආර්ථිකයේ සම්පත් වෙන් කිරීම සහ භාවිතය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති නොකළ යුතු අතර, නිසැකවම එම බදු ආදායමට වඩා වැඩි මුදලක් නොවිය යුතුය.

නවීන බදු සඳහා ශක්තිමත් පදනමක් මෙමගින් සපයන නමුත්, සාධාරණ බදුකරණය පිළිබඳ ඇඩම් ස්මිත්ගේ න්‍යාය සැමවිටම උත්ථානුමත නොකෙරේ. සාධාරණ බදු ප්‍රතිපත්තිය පිළිබඳ න්‍යායන් රාශියක් ඇතත්, බදු පිළිබඳ යථාර්ථය රටකින් රටකට සහ ආර්ථිකයකින් ආර්ථිකයකට වෙනස් වේ.

ගෝලීය බදුකරණ භාවිතයන්, විශේෂයෙන්ම සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර සැලකිය යුතු හරස් විෂමතා පෙන්නුම් කරයි. රටේ බදු සෘජු හා වක්‍ර බදු ලෙස බෙදිය හැකිය. නිදසුනක් වශයෙන්, අද සංවර්ධිත රටවල් සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා ඔවුන්ගේ ජාතික නිෂ්පාදනයෙන් විශාල කොටසක් බදු වශයෙන් එකතු කරන අතර ඔවුන් එසේ කිරීමේදී ආදායම් බදු මත වැඩි විශ්වාසයක් තැබීමට නැඹුරු වේ. සංවර්ධනය වෙමින් පවතින රටවල්, ඊට පරස්පර ලෙස, වෙළඳ බදු මත මෙන්ම පරිභෝජනය මත වන බදු මත දැඩි ලෙස රඳා පවතී. එබැවින් සෘජු හා වක්‍ර බදු වලින් උපයා ගන්නා බදු ආදායමේ අනුපාතය ආදායම් බෙදා හැරීම සහ ආර්ථික වර්ධනය මත වැදගත් ප්‍රතිවිපාක ඇති කරයි.

ශ්‍රී ලංකාවේ, ආදායම් බදු (ඍජු බදු) සාමාන්‍යයෙන් බදු ආදායමෙන් 20% ට හෝ දළ දේශීය නිෂ්පාදිතයෙන් 2% ට වඩා අඩු වන අතර, වක්‍ර බදු, බදු ආදායමෙන් 80% හෝ දළ දේශීය නිෂ්පාදිතයෙන් 8% ක් පමණ වේ. ශ්‍රී ලංකාව වැනි රටකට අපේ බදු ව්‍යූහයේ ඇති මෙම අසමානතාවය දුරලීම දුෂ්කරය. අවම වශයෙන් ඍජු බදු සහ වක්‍ර බදු අතර පරතරය අවම කිරීමට විවිධ අවස්ථාවල උත්සාහ දරා ඇත. මෙම සන්දර්භය තුළ, 2009 දී බදුකරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව විසින් නිර්දේශ කර තිබුණේ ඍජු බදු සහ වක්‍ර බදු අනුපාතය ක්‍රමානුකූලව 60:40 දක්වා වෙනස් කළ යුතු බවයි.

1. බදු ආදායම, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස (2010-2022)

| Year | Tax revenue Rs. Mn | GDP % |
|---|---|---|
| 2010 | 724,747 | 12.9 |
| 2011 | 845,697 | 12.4 |
| 2012 | 908,913 | 12 |
| 2013 | 1,005,895 | 11.6 |
| 2014 | 1,050,362 | 10.1 |
| 2015 | 1,355,779 | 12.4 |
| 2016 | 1,463,689 | 12.3 |
| 2017 | 1,670,178 | 12.4 |
| 2018 | 1,712,318 | 11.9 |
| 2019 | 1,734,925 | 11.6 |
| 2020 | 1,216,542 | 8.1 |
| 2021 | 1,298,019 | 7.4 |
| 2022 | 1,751,132 | 7.3 |
| 2023 | 3,130,000 | 10.3 |

මූලාශ්‍ර: මහ බැංකු වාර්ෂික වාර්තාව 2022
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය




ශ්‍රී ලංකාවේ බදු ව්‍යුහය සම්පූර්ණයෙන්ම භාණ්ඩ හා සේවා බදු මත රඳා පවතී. මීට අමතරව ආනයනික භාණ්ඩ මත බදු පැනවීම මෙන්ම මධ්‍යසාර, දුම්වැටි වැනි අනම්‍ය භාණ්ඩ සඳහා බදු පැනවීම ද වරින් වර විශාල වෙනස්කම්වලට භාජනය වේ. එබැවින්, මෙම කාල සීමාව තුළ මුළු බදු ආදායමෙන් 80% ක් වන පරිභෝජනය පාදක කරගත් බද්ද, බදු ආදායමේ ප්‍රධාන මූලාශ්‍රය විය. මෙම සන්දර්භය තුළ, 2010 සිට 2022 දක්වා කාල පරිච්ඡේදය තුළ බදු ආදායම නාමික වශයෙන් වැඩි වුවද දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම පහල ගියේය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය බදු ආදායමේ මෙම පහත වැටීමේ ප්‍රවණතාවයට එක් ප්‍රධාන හේතුවක් වන්නේ රාජ්‍ය මූල්‍ය ක්‍රමයේ පවතින නෛසර්ගික නම්‍යශීලීතාවය (elasticity) සහ උත්ප්ලාවිතාව (buoyancy) නොමැති වීමයි.

බදු උත්ප්ලාවිතාව මගින් දළ දේශීය නිෂ්පාදිතයේ වෙනස්වීමට සාපේක්ෂව බදු ආදායම වැඩි වන්නේ හෝ අඩු වන්නේ කොපමණ ප්‍රමාණයකින්ද යන්න දක්වයි. ශ්‍රී ලංකාවේ 1 ට අඩු බදු උත්ප්ලාවිතාවක් ඇති අතර එමගින් දැක්වෙන්නේ ආර්ථිකය ප්‍රසාරණය වීම සමඟ බදු ආදායමේ වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට සමානුපාතික නොවන බවයි. මෙමගින් ආදායමේ හිදැස් සහ අයවැය සංරෝධක ඇති කරයි.

බදු උත්ප්ලාවිතාව → බදු ආදායම වෙනස් වීමේ ප්‍රතිශතය / දළ දේශීය නිෂ්පාදිතය වෙනස්වීමේ ප්‍රතිශතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ බදු ව්‍යුහය දැක්වෙන රූ සටහන අනුව වසර 10 ක් ශ්‍රී ලංකාවේ බදු ව්‍යුහයේ කැපී පෙනෙන වෙනසක් සිදු වී නොමැත. 2010 වසරට සාපේක්ෂව 2022 වසර වනවිට ආදායම් බදු ප්‍රතිශතය 17% සිට 27% දක්වා වැඩි වී ඇත. මෙයට හේතුව වන්නේ රජයේ ප්‍රතිපත්ති වෙනස්කම් හේතුවෙන් ආදායම් බදු අනුපාතවල සිදුවූ මෑත කාලීන වෙනස්වීමයි. ඒ හැර අනෙකුත් බදුවල කැපී පෙනෙන වෙනස්කමක් සිදුවී නොමැත.

1. 2010 සහ 2022 වසරවල රාජ්‍ය ආදායමේ සංයුතිය




2010 වසරේ රජයේ ආදායම් සංයුතිය




2022 වසරේ රජයේ ආදායම් සංයුතිය

මූලාශ්‍රය: 2010 සහ 2022 වසරවල ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

ශ්‍රී ලංකාවේ බදු ව්‍යුහයේ හඳුනාගෙන ඇති පොදු දුර්වලතා නම්:

- විවිධ බදු විරාම, සහන සහ අනුග්‍රහ ආදී සැලසුම් නොකළ තත් කාලීන බදු සහන
- පටු බදු පදනම සහ ආවරණය, උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ මුළු බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව ජනගහනයෙන් 3% ක් පමණ වේ.
- දේශීය ආදායම් පනතේ 25 වැනි වගන්තිය යටතේ අවසරලත් වියදම් වැඩි කිරීම (මෙය මෑතකදී වෙනස් කර ඇත)
- කාලානුරූප බදු නිදහස් දීමනා මත බදු අනුපාත තත් කාලීන ලෙස අඩු කිරීම සහ ප්‍රතිපත්ති වෙනස් කිරීම
- රජයේ ආදායමේ / රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ සංගතතාවයක් (consistency) නොමැතිකම: රජයේ කෙටිකාලීන මුදල් ප්‍රවාහ අවශ්‍යතා සපුරාලීම සඳහා රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා බදු ක්‍රමයේ තත් කාලීන වෙනස්කම්
- බදු ක්‍රමයේ නම්‍යශීලීතාවය සහ උත්ප්ලාවිතාවයක් නොමැතිකම
- විශාල අවිධිමත් අංශයක් පැවතීම සහ තවමත් එම අංශය බදු අය කිරීම සඳහා ඇතුලත් කොට ගෙන නොමැති වීම
- සංකීර්ණ බදු ක්‍රමය සහ බදු පරිපාලනයේ දුර්වලතාවය

විවිධ බදු ප්‍රතිසංස්කරණ යෝජනා තුළින් මෙම පොදු දුර්වලතා හෙළිදරව් කොට තිබුනද තවමත් එම ගැටලුවලට නිසි විසඳුම් ලැබී නොමැත. ශ්‍රී ලංකාවේ බදු ව්‍යුහය වෙනස් කිරීමේදී තවදුරටත් අවධානය යොමු කළ යුතු කරුණු ගණනාවක් තිබේ.

- ආයෝජන දිරිගැන්වීමේ අරමුණින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හරහා ඇතැම් විදේශීය ව්‍යාපෘති සඳහා ලබා දී ඇති බදු සහන දේශීය ආයෝජකයින් අතර තරගයක් ඇති කර ඇති අතර සමහර බදු සහන යථාර්ථවාදී නොවේ. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ බදු නිදහස් කිරීම් සහ බදු විරාම හේතුවෙන් වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ආදායමෙන් 1% ක පමණ ආදායම් අහිමි වීමක් සිදු වී ඇති අතර එකතු කිරීමේ අගය මත බදු සහ ආනයන බදු මත වරින් වර විවිධ බදු නිදහස් කිරීම්ද බදු ආදායම අඩු වීමට බලපා ඇත.

- ආදායම් බදු අනුපාත පැනවීමේදී ඉහළ ආදායම් සඳහා ඉහළ බදු අනුපාත පැනවීම තාර්කිකකරණය
  බදු ගෙවන්නා අධෛර්යමත් වන අයුරින් ඉහළ බදු අනුපාත නොපැනවිය යුතුය. එබැවින් ආදායම් කණ්ඩායම් ගණනාවක් හරහා බදු ව්‍යුහය පුළුල් කිරීම වඩාත් සාධාරණ ය. (බදුකරණයේ සමාජ පිරිවැය)

- සාධාරණත්වය ඇති කිරීම සඳහා තෝරාගත් අත්‍යාවශ්‍ය ආනයනික භාණ්ඩ සඳහා පනවා ඇති තනි තීරු බදු අනුපාත (විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද) එම අරමුණු ඉටු නොකරයි. ඇතැම් විට, බද්ද ක්‍රියාත්මක කරන කාල සීමාව තුළ දේශීය මිල උද්ධමනය හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගත නොහැකිය.

- ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වීමට අනුකූලව බදු පදනම පුළුල් වී නොමැත. උදාහරණයක් ලෙස කැසිනෝ ව්‍යාපාර, ඩිජිටල් සේවා (digital services) බදු ව්‍යුහයට ඇතුලත් වී නොමැත.

- භාණ්ඩ හා සේවා ආනයනය පිළිබඳ මනා විශ්ලේෂණයකින් තොරව ආනයන මත බදු පැනවීම අපනයන තරඟකාරීත්වය දුර්වල කරයි.

- උද්ධමනයේ හා වෙනත් මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම විසින් බදු ආදායම වැඩිවීමක් පෙනීගියද එය වෙනම ගණනය කිරීමක් සිදු නොවන නිසා බදු ප්‍රතිපත්තිය නිසා පමණක් සිදුවන බදු ආදායමේ ඉහල/පහල යෑම ගණනය කිරීම අසීරු වී ඇත.

# රජයේ ආදායම

**පසුබිම**

රටක බදු ආදායම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන සංරචකය ලෙස සලකනු ලැබේ. ශ්‍රී ලංකා රජය සෘජු බදු සහ වක්‍ර බදු ලෙස බදු වර්ග දෙකක් පනවයි. ප්‍රධාන ආයතන තුනක්, එනම් ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විවිධ බදු ලෙස රජය වෙනුවෙන් ආදායම රැස් කරයි.

රජයේ ආදායම - 2022

| දෙපාර්තමේන්තුවේ නම | 2022 වසර සඳහා රජයේ ආදායමේ ප්‍රතිශතය (%) | 2023 වසර සඳහා අපේක්ෂිත රජයේ ආදායමේ ප්‍රතිශතය (%) |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 49.93 | 49 |
| ශ්‍රී ලංකා රේගුව | 25 | 36 |
| ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | 7.89 | 6 |
| උප එකතුව | 82.82 | 91 |
| අනෙකුත් සියළු රජයේ ආයතන | 17.18 | 9 |
| එකතුව | 100 | 100 |

මූලාශ්‍රය - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

2023 වර්ෂයේ අපේක්ෂිත රජයේ ආදායමෙන් සියයට අනූ එකක් (91%) බදු ආදායමෙන් සමන්විත වේ.

2023 වර්ෂයේ අයවැය මඟින් 2023 වර්ෂය තුළදී එක් එක් ආයතනය විසින් පහත දැක්වෙන ආදායම් ප්‍රමාණ රැස් කිරීම අපේක්ෂා කරන අතර එම එක් එක් ආයතනය විසින් 2023 ජනවාරි 1 වැනි දින සිට ජූනි 30 වැනි දින දක්වා කාල පරිච්ඡේදය තුළ දැනටමත් රැස් කරන ලද ආදායම පහත දැක්වෙන පරිදි වේ.

| ආයතනය | 2023 අයවැය මඟින් අපේක්ෂිත ආදායම (රු.) (මිලියන) | 2023 ජනවාරි සිට ජූනි දක්වා එකතු කරන ලද ආදායම (රු.) (මිලියන) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 1,667,000 | 696,946 | 41.81 |
| ශ්‍රී ලංකා රේගුව | 1,220,000 | 400,074 | 32.79 |
| ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | 217,000 | 88,963 | 41.00 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනවල සංඛ්‍යා ලේඛන

රජයේ ආදායමේදී රජය විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන අභියෝගය වන්නේ රජයේ වියදම් රජයේ ආදායම ඉක්මවා යාම හේතුවෙන් දිගින් දිගටම පවතින අයවැය හිඟයයි. 2023.01.01 සිට 2023.06.30 දක්වා කාලපරිච්ඡේදය සඳහා අයවැය හිඟය රු. මිලියන 1,242,566 කි. (මූලාශ්‍රය: මධ්‍ය වාර්ෂික මූල්‍ය වාර්තාව) 2022 වර්ෂයේ අප්‍රේල් මාසයෙන් පසු විදේශ ණය ගෙවීම අත්හිටවූ අතර පොලී ගෙවීම ආසන්නයෙන් දෙගුණ වීම හේතුවෙන් 2022 පළමු අර්ධයට සාපේක්ෂව රජයේ වියදම වැඩි වී ඇත.

# ශ්‍රී ලංකා රේගුව

**පසුබිම**

ආනයන සහ අපනයන බදු, වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද (PAL), එකතු කළ අගය මත බද්ද (VAT), විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL), නිෂ්පාදන බදු (දුම්වැටි, ඛණිජ තෙල් නිෂ්පාදන සහ මෝටර් වාහන), ජාතිය ගොඩ නැගීමේ බද්ද (NBT), සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සහ ආනයන සහ අපනයන සෙස් බද්ද ඇතුළු විවිධ වර්ගවල බදු සහ තීරු බදු හරහා ශ්‍රී ලංකා රේගුව එහි ආදායම් රැස් කරයි.

| බදු වර්ගය | 2022 වර්ෂය තුළ බදු එකතුව (රු. මිලියන) | 2023 වර්ෂයේ ජනවාරි මස සිට ජුනි මස දක්වා බදු එකතුව (රු. මිලියන) | භාණ්ඩාගාරය මඟින් 2023 වසර සඳහා පුරෝකථනය කරන ලද බදු එකතුව (රු. මිලියන) |
|---|---|---|---|
| ආනයන බද්ද | 43,150.28 | 26,303.23 | 80,000 |
| අපනයන බද්ද | 21.79 | 12.34 | 53 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 165,882.90 | 72,143.86 | 220,000 |
| එකතු කළ අගය මත බද්ද | 168,661.86 | 97,256.47 | 355,000 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 36,307.63 | 24,106.22 | 70,000 |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද | 2.65 | 1.60 | 10 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 13,119.02 | 23,734.48 | 64,000 |
| නිෂ්පාදන බදු | 0.65 | 0.54 | 0.34 |
| ආනයන සෙස් බද්ද | 66,213.44 | 27,696.74 | 82,000 |
| අපනයන සෙස් බද්ද | 2,152.43 | 944.58 | 3,000 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

2023 වර්ෂය වෙනුවෙන් ප්‍රවණතා විශ්ලේෂණය කිරීම මගින් ශ්‍රී ලංකා රේගුව 2023 වර්ෂය වෙනුවෙන් පුරෝකථනය කළ ආදායම රු.මිලියන 638,673 ක් වෙද්දී මහා භාණ්ඩාගාරය රු.මිලියන 1220,784 ක ඉලක්කයක් නියම කළ අතර ශ්‍රී ලංකා රේගුව විසින් පුරෝකථනය කරන ලද ආදායම සහ මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ඉලක්කගත ආදායම අතර වෙනස රු. මිලියන 582,111ක් වේ.

ශ්‍රී ලංකා රේගුව එහි ඉහළම ආදායම වූ රු. මිලියන 923,105 ක් 2018 වර්ෂයේදී රැස් කළ අතර 2019 වසරේ සිදුවූ පාස්කු ප්‍රහාරය සහ 2020 වසරේ කොවිඩ් 19 ගෝලීය වසංගතය පැතිරීමෙන් පසුව ලබා දෙන ලද බදු සහන සහ පනවන ලද වෙළඳ සීමා හේතුවෙන් 2019 සහ 2020 වසරවල රජයේ ආදායම එකතු කිරීම අඩු විය.

විදේශ විනිමය හිඟය යන ගැටළුව ජය ගැනීමේ විසඳුමක් ලෙස ශ්‍රී ලංකාවට ආනයනය කෙරෙන අයිතම 1200 ක් තාවකාලිකව අත් හිටුවීම ඇතුළුව රජය විසින් පනවන ලද

කොන්දේසිවලට අනුකූල වෙමින් අපේක්ෂිත ආදායම වන රු. ට්‍රිලියන 1.2 අත්කර ගත යුතු බව කාරක සභාව අවධාරණය කළේය.

විදේශ වෙළඳාමේදී වැරදි ලෙස ඉන්වොයිසි සැකසීමේ ප්‍රතිඵලයක් ලෙස ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 2 ක් වාර්ෂිකව ආදායම් කාන්දුවීමක් හෙළි කළ ගෝලීය මූල්‍ය සුපිළිපන්බව වාර්තාව (Global Financial Integrity Report) කෙරෙහි කාරක සභාවේ අවධානය යොමු විය. (මූලාශ්‍රය: https://gfintegrity.org/report/trade-related-illicit-financial-flows-in-134-developing-countries-2009-2018/)

අධි ඉන්වොයිසි කිරීම හා ඌන ඉන්වොයිසි කිරීමට අදාලව පහත දැක්වෙන ප්‍රධාන ගැටළු දෙක හඳුනා ගැණිනි.

- වැරදි ලෙස ඉන්වොයිසි සැකසීම (mis-invoicing) හේතුවෙන් බදු මග හැරීම
- විදේශ විනිමය ශ්‍රී ලංකාවට එවීමෙන් තොරව විදේශ රටවල තැන්පත් කිරීම

ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානය (OECD) මූල බාදනය සහ ලාභ මාරු කිරීම (Base Erosion Profit Shifting) යන ගැටළුවට විසඳුම් සැපයීමේදී හා විවිධ මූල බාදන සහ ලාභ මාරු කිරීමේ උපායමාර්ග සහ හිඩැස්වලට විසඳුම් සැපයීමට නිශ්චිත ක්‍රියාමාර්ග 15 ක් දක්වන මූල බාදනය සහ ලාභ මාරු කිරීම පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරයි. G20 රටවල් මූල බාදනය සහ ලාභ මාරු කිරීම පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කළ අතර අඛණ්ඩ සහයෝගිතාව හරහා මතු වන මූල බාදන සහ ලාභ මාරු කිරීමේ ගැටළුවලට විසඳුම් සැපයීමේ නිරත වී සිටී.

2023 ජුනි මස 9 වන දින වන විට "ආර්ථික ඩිජිටල්කරණය වෙතින් පැන නගින බදු අභියෝගවලට විසඳුම් සැපයීම සඳහා වන ද්විත්ව කුළුණු විසඳුම පිළිබඳ ප්‍රකාශය" ට රටවල් 139 ක් අත්සන් කරන ලදී. බහුජාතික ව්‍යාපාර 15% ක අවම බදු අනුපාතිකයකට යටත් කෙරෙනු ඇති බවට ද්විත්ව කුළුණු විසඳුම පිළිබඳ ප්‍රකාශය සහතික වනු ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව මෙතෙක් මෙම ගිවිසුමට එක් වී නොමැත.

**නිරීක්ෂණ**

කාරක සභාව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කළේය:

- 2023 ජුනි මස 30 වන දිනට ශ්‍රී ලංකා රේගුවේ හිඟ බදු ප්‍රමාණය රු. බිලියන 6.71 කි. (ඇමුණුම II)

- ආනයනය කළ භාණ්ඩවල අගය තක්සේරු කිරීමේදී මෙන් නොව, අපනයන භාණ්ඩ අගය සත්‍යාපනයට (verification) භාජනය නොවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ ඉන්වොයිසි වැරදි ලෙස සකස් කිරීම සිදු වේ. නීත්‍යානුකූල බැංකු පද්ධතිය හරහා නිවැරදි අපනයන ඉපයීම් ශ්‍රී ලංකාව තුළට ගෙන නොඒමට මෙය මග පාදා ඇත.

- ආනයන වෙළදාමේදී අධි ඉන්වොයිසි කිරීම (over-invoicing) සිදුවේ. අධි ඉන්වොයිසි කිරීමේදී අනෙකුත් රටවල විදේශ විනිමය තැන්පත් කිරීම වැළැක්වීම සඳහා ඒකක අනුපාතික ප්‍රතිශතය හෝ වටිනාකම අනුව අනුපාතික ප්‍රතිශතය (ad-valorem rate) යන ඒවායින් ඉහළ අගය මත බදු පනවනු ලැබේ.

- ඌන ඉන්වොයිසි කිරීමේදී (under-invoicing) තීරු බදු හා වෙළදාම පිළිබඳ පොදු සම්මුතියට අනුව (GATT) අපනයන භාණ්ඩ අගය තක්සේරු කිරීම තීරණාත්මක වන අතර එබැවින් ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවලට භාණ්ඩ අපනයනය කරන විට භාණ්ඩ ගොඩබාන වරායේදී අපනයනවල වටිනාකම ප්‍රකාශ නොකිරීම වැළැක්වීම සඳහා තාක්ෂණික සහ නෛතික ක්‍රියාමාර්ග ඇතුළුව ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගත යුතුය.

- ශ්‍රී ලංකාවෙන් යැවෙන අපනයනවල වටිනාකම භාණ්ඩ පටවන වරායේදී සහ ගොඩබාන වරායේදී සත්‍යාපනය කිරීම හා සැසඳීම සඳහා නිසි නියාමන යාන්ත්‍රණයක් ශ්‍රී ලංකා රේගුව සතුව නොමැති වීම හේතුවෙන් සහ භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීමේදී මුහුණ දෙනු ලබන දුෂ්කරතා හේතුවෙන් ශ්‍රී ලංකා රේගුවට එහි ආදායම අහිමි වෙමින් පවතී.

- රජය විසින් පනවන ලද ආනයන සීමා උල්ලංඝණය කිරීම හේතුවෙන් රේගුව විසින් වාහන දෙසිය හතළිහක් (240) රඳවා ගනු ලැබූ අතර නීති විරෝධී ආකාරයට ආනයනය කරන ලද භාණ්ඩ රාජසන්තක කිරීමක් නොතිබියදීත් මෙම වාහන වෙන්දේසි කිරීමෙන් ලබා ගත හැකි මුදල්වලින් වැඩි ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට හැකියාවක් නොමැත.

- රු.2,221,633,341 වන මැණික් නිෂ්කාශනයෙන් උපයන ලද ඉහළම ආදායම 2005 වර්ෂයේදී රැස් කර ගන්නා ලද අතර ප්‍රමාණය කුමක් වුවද ශ්‍රී ලංකා රේගුව වෙත ඇමරිකානු ඩොලර් 200 ක් පමණක් ගෙවීමෙන් විශේෂ රේගු ක්‍රියාපටිපාටියක් හරහා මැණික් නිෂ්කාශනය පිණිස ඉඩ සලසන 2012.06.15

දිනැති අංක 1762/40 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය බලාත්මක කිරීමත් සමඟ වඩා ඉහළ ආදායමක් උත්පාදනය කරනු ලැබ ඇත.

- මෘදුකාංග වැනි ඩිජිටල් අන්තර්ගතය ආනයනය මත බදු කිසිවක් පනවනු නොලබන අතර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ව්‍යාපාරය දිනෙන් දින දියුණු වන ව්‍යාපාරයක් වන බැවින්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට බදු පැනවීම අවශ්‍යය.

- ශ්‍රී ලංකා රේගුවේ ස්කෑනර් යන්ත්‍ර සවි කිරීම සහ පරීක්ෂා කිරීමේ ක්‍රම වැනි දියුණු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම මගින් භාණ්ඩ පරීක්ෂා කිරීමේදී මානව මැදිහත්වීම අඩු කරනු ලැබිය යුතුය.

- ආනයනය කෙරෙන සහ අපනයනය කෙරෙන භාණ්ඩ වරායවලදී සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා භාවිතා කෙරෙන ශ්‍රී ලංකා රේගුවේ ස්කෑනර් යන්ත්‍ර නිසි ලෙස ක්‍රියාත්මක නොවන බැවින් හා අතින් ක්‍රියාකරවීම හේතුවෙන් ඒවා ඌන උපයෝජන මට්ටමක පවතී.

- විවිධ භාණ්ඩ සඳහා විටින් විට අය කරන තීරුබදු හෝ විශේෂ වෙළඳ භාණ්ඩ බදු අඩු කිරීම/වැඩිකිරීම මගින් තොග රැස්කරන්නන් හට දැවැන්ත අතිරේක ලාභ ලැබීම වැළැක්වීමට රේගුව/ආනයන අපනයන පාලක හෝ මුදල් අමාත්‍යාංශය පියවර ගෙන නොමැත.

- ආනයන සහ අපනයන නිෂ්කාශන ක්‍රියාවලියේදී තොගය හිමිකරු (ආනයනකරු හෝ අපනයනකරු) සහ රේගු නිලධාරි අතර ගෙවීම්, අනුමැතිය සහ තක්සේරු ක්‍රියාවලිය පූර්ණ ලෙස ස්වයංක්‍රීයව සිදු නොකෙරෙන අතර මානව මැදිහත් වීම, උදා. ආනයන සහ අපනයන නිෂ්කාශන ක්‍රියාපටිපාටිවලදී වාප්පු ලිපිකරුවන් සම්බන්ධ වීම, දූෂණයට මග පෑදීමට ඉඩ ඇත.

- තනි කවුළු පද්ධතිය (Single Window System) ක්‍රියාත්මක කිරීම මඟින් ආයෝජකයන් හට රජයේ ආයතන ගණනාවකට යාමේ සහ අනවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව තුරන් කරන අතර මධ්‍යගත ඩිජිටල් වේදිකාවක් පිහිටුවීම මගින් ප්‍රමාදයන් සහ එකම කාර්යය නැවත නැවත කිරීම අඩු කර පරිපාලන ක්‍රියාවලිය සරල කිරීමට සහ වේගවත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

- ශ්‍රී ලංකා රේගුවේ සහභාගිත්වය ඇතිව සියළු බහලුම් පරීක්ෂා කිරීම පිණිස, ඉඟුරුකඩේ සහ ඔරුගොඩවත්ත වැනි විවිධ ස්ථානවල පිහිටා ඇති ශ්‍රී ලංකා රේගුවේ අංගන 4 එකට එක් කරමින් පොදු බහාලුම් අංගනයක් කෙරවලපිටියේ ගොඩ නැගීමට නියමිතව ඇත.

- රේගු නිලධාරීන්ට ඔවුන්ගේම තීන්දු ලබා දිය හැකි ආකාරයට රේගු ආඥාපනත ඉතා බලවත් බැවින් විසි එක්වැනි සියවසට ගැලපෙන ආකාරයට එම ආඥාපනත සංශෝධනය කරනු ලැබිය යුතුය.

- රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ වන්දි අරමුදලට (Reward Fund) ලැබෙන ප්‍රතිශතය අඩු කිරීම සහ රේගුව හා සබැඳි අභියාචනා සහ විමර්ශන වේගවත් කිරීම වැනි අරමුණු ඉටු කර ගැනීම සඳහාද රේගු ආඥාපනත සංශෝධනය කිරීම අවශ්‍ය වී ඇත.

- රේගු අභියාචනා ක්‍රියාවලිය සඳහා විශාල කාලයක් ගතවන අතර එය කලට වේලාවට විසඳුම් බලාපොරොත්තු වන ආනයනකරුවන් සහ අපනයනකරුවන් කලකිරීමට පත් කරවන දීර්ඝ ක්‍රියාවලියකි. රේගු විමර්ශන සහ අභියාචනා අවම කාල පරිච්ඡේදයක් තුළ අවසන් කරනු ලැබිය යුතුය.

- බහාලුම් 965 ක් ශ්‍රී ලංකා රේගුව විසින් රඳවා ගනු ලැබ ඇති අතර අවසන් කළ යුතුව ඇති රේගු විමර්ශන/පරීක්ෂණ, ආනයන තාවකාලිකව අත්හිටුවීම පිළිබඳ නියෝග සහ අධිකරණය ඉදිරියේ පවතින නඩුවලට අදාල අවසන් තීරණ ලැබිය යුතුව තිබීම හේතුවෙන් ඒවා වරාය අංගන තුළ හෝ රේගු පරීක්ෂණ අංගනවල රඳවා තිබේ.

- දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ඇතැම් පාරිභෝගික භාණ්ඩ මත බදු ගණනාවක් පැනවීමට රජය තීරණය කර ඇත.

- ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා විධිමත් කාර්යසාධන ඇගයීමේ ක්‍රමවේදයක් නොමැත.

- ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පද්ධතිය යාවත්කාලීන කළ යුතු අතර අනෙක් රාජ්‍ය ආයතනවල තොරතුරු තාක්ෂණ පද්ධති සමඟ අන්තර්සම්බන්ධ කිරීමේ හැකියාව පැවතිය යුතුය.

- මූල්‍ය දිරිදීමනා නොමැති වීම, නුසුදුසු ස්ථානමාරු ප්‍රතිපත්තිය සහ ඌන උපයෝජිත පුහුණු අවස්ථා හේතුවෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය (ICT Directorate) තුළ දැනුම සහ විශේෂඥභාවය රඳවා ගැනීම අභියෝගයට ලක්ව ඇත.

- ශ්‍රී ලංකාව ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානයේ/ G20 මූල බාදනය සහ ලාභ මාරු කිරීම පිළිබඳ අන්තර්කරණ රාමුවේ සාමාජිකයකුව සිටියදී " ආර්ථිකය ඩිජිටල්කරණය වෙතින් පැන නගින බදු අභියෝගවලට විසඳුම් සැපයීම සඳහා වන ද්විත්ව කුළුණු විසඳුම පිළිබඳ ප්‍රකාශය" ට එක් වී නොමැත.

**නිර්දේශ**

- ආනයන අපනයන වෙළඳාමේ වැරදි ලෙස ඉන්වොයිසි කිරීම (mis-invoicing) වැළැක්වීම පිණිස පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ:
  - වෙළඳ ක්‍රියාවලි පූර්ණ ලෙස ඩිජිටල්කරණය කිරීම. දත්ත/ලේඛණ ඉලෙක්ට්‍රොනිකව හුවමාරු කිරීමට හැකියාව ලබා දීම සහ එකම රටේ පාර්ශ්වකරුවන් අතර පමණක් නොව දේශ සීමා හරහා කෙරෙන වෙළඳාම හා සබැඳි දත්ත සහ ලේඛන නෛතිකව පිළිගැනීම.
  - වෙළඳ ගනුදෙනු වඩාත් විනිවිදභාවයෙන් යුතු බවට පත් කිරීම පිණිස සහ ජාත්‍යන්තර දේශ සීමා හරහා වැඩියෙන් මූල්‍ය තොරතුරු සහ වෙළඳ ලේඛන ඉලෙක්ට්‍රොනිකව හුවමාරු කර ගැනීමට හැකියාව ලබා දෙනු පිණිස ආනයනය කරන සහ අපනයනය කරන රටවල් අතර තොරතුරු බෙදා ගැනීම පුළුල් කිරීම.
  - වෙළඳාමේ වැරදි ලෙස ඉන්වොයිසි කිරීම නීති විරෝධී තත්ත්වයට පත් කිරීම සහ ඊට එරෙහිව ජාතික මට්ටමේදී රේගු බලධරයන්ගේ නීතිය ක්‍රියාවේ යෙදවීම ශක්තිමත් කිරීම.
  - හවුල්කාර රටවල් අතර ඩිජිටල් වෙළඳ පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම.
  - රේගු බලධාරීන්ට දත්ත හුවමාරු කර ගැනීමට සහ වෙළඳාමේ වැරදි ලෙස ඉන්වොයිසි කිරීම හඳුනාගැනීමට හැකියාව ලබා දෙන බ්ලොක්චේන් (Blockchain) තාක්ෂණය හා කෘතිම බුද්ධි තාක්ෂණය (AI Technology) ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිතා කිරීම. මේ ආකාරයට ශ්‍රී ලංකා රේගුවට ඔවුන්ගේ වෙළඳ හවුල්කාර රේගු දෙපාර්තමේන්තු සමඟ භාණ්ඩ අගය තක්සේරුව ඇතුළු ගනුදෙනු දත්ත තථ්‍ය කාලයට හුවමාරු කිරීමට අවස්ථාව ලැබෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මිලෙහි විෂමතා පහසුවෙන් හඳුනාගත හැකි වනු ඇත.
  - රේගු නිලධාරීන් ඉන්වොයිසිවල ප්‍රකාශිත භාණ්ඩ මිල ගණන් එම භාණ්ඩවල මෑතකාලීන ගෝලීයව පවත්නා සාමාන්‍ය මිල සමඟ සැසඳීම සම්බන්ධ වන "මිල පෙරහන් ක්‍රමය" (Price - Filter Method) හඳුන්වාදීම. මෙම ක්‍රියාවලිය, අපනයනකරුවන් සහ ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරන ලද වත්මන් ඉන්වොයිසිවල ප්‍රකාශිත වංචනික විය හැකි අගයන් ඉක්මනින් හඳුනා ගෙන එබඳු ඉන්වොයිසි වැඩිදුර විමර්ශනය කිරීමට සලකුණු කිරීම සඳහා වහා පියවර ගැනීමට රේගු නිලධාරීන්ට හැකියාව ලබා දෙයි.

  යොමුව: https://gfintegrity.org/report/trade-related-illicit-financial-flows-in-134-developing-countries-2009-2018/

- අපනයන ඌන ඉන්වොයිසි කිරීම (under-invoicing) වැළැක්වීම සඳහා වෙනත් රටවල රේගු කාර්යාංශ සමග සම්බන්ධීකරණයෙන් භාණ්ඩ ගොඩබාන වරායේදී

ප්‍රකාශ කෙරෙන අපනයනවල අගය භාණ්ඩ පටවන වරායේ රේගු කාර්යාංශයට දැනුම් දීමේ යාන්ත්‍රණයක් සකස් කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- රජය විසින් පනවන ලද ආනයන සීමා උල්ලංඝණය කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා රේගුව විසින් රඳවා ගනු ලැබ තිබෙන වාහන 240 සම්බන්ධයෙන් මාස 6 ක් තුළ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කෙරේ. විදේශ විනිමය ගැටළුවේ බලපෑම සමනය කිරීම සඳහා වාහන ආනයනය තාවකලිකව අත්හිටුවීම පිණිස මහා භාණ්ඩාගාරය විසින් ගන්නා ලද ප්‍රතිපත්ති තීරණයක ප්‍රතිඵලයක් ලෙස මෙම වාහන රඳවා ගන්නා ලද හෙයින්, මෙම වාහන වෙන්දේසි කර වෙන්දේසියෙන් ලැබෙන මුදල් ඍජුවම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගත යුතු යැයි නිර්දේශ කෙරේ.

- මෙම වාහන වෙන්දේසි කිරීමෙන් අත් කර ගනු ලබන ආදායමින් වඩා වැඩි ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමේ හැකියාව ලබා දෙමින් 2019 අංක 21 දරන මුදල් පනත සහ රේගු ආඥාපනත සංශෝධනය කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- 2012.06.15 දිනැති 1762/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සංශෝධනය කරමින්, මැණික්වල වටිනාකම මත මැණික් සඳහා බදු සහ තීරු බදු පැනවීමටත් ඒකක සංඛ්‍යාව රේගුවට ප්‍රකාශ කිරීමටත් නිර්දේශ කෙරේ.

- විදේශගත වීමේදී රැගෙන යන විදේශ විනිමය, රන් සහ ස්වර්ණාභරණ ප්‍රමාණය නියාමනය කිරීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සංශෝධනය කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- ඩිජිටල් අන්තර්ගතයන් සහ සේවා සඳහා සංයෝජිත වර්ගීකරණ අංක (HS codes) හඳුන්වා දීමටත්, ඩිජිටල් සේවාවන් සඳහා නව බද්දක් හඳුන්වා දීමටත් නිර්දේශ කරන අතර එම නව බද්ද හඳුන්වා දීමට පෙර එය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට බලපාන ආකාරය පිළිබඳව සහ අනෙකුත් රටවල හොඳම ක්‍රමවේදයන් පිළිබඳව පුළුල් අධ්‍යයනයක් කිරීම යෝග්‍ය වේ.

- රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය (PPP ආකෘතිය) තුළින් පවත්වාගෙන යනු ලබන පසු මෙහෙයුම් කාර්යාලයක් හරහා ASYCUDA පද්ධතිය කළමනාකරණය කර පවත්වාගෙන යා යුතු බවට නිර්දේශ කරන අතර ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතියට අන්තර්සම්බන්ධ කළ හැකි වන පරිදි එය වැඩිදියුණු කළ යුතුය. ASYCUDA පද්ධතිය තුළ ඒකීය හඳුනාගැනීමේ අංකය (unique identification number) ලෙස ශ්‍රී ලංකා ඒකීය ඩිජිටල් අනන්‍යතාවය (UDI) යොදා ගැනීමට නිර්දේශ කෙරේ.

- ආනයන අපනයන ක්‍රියා පටිපාටිවලදී මානව මැදිහත්වීම අවම කරනු ලබන බවට වග බලා ගනිමින් ආනයනය කරන ලද සහ අපනයනය කරනු ලබන භාණ්ඩ

සෝදිසි කිරීම හා පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් වරායේ දී භාවිතා කරන ස්කෑනින් යන්ත්‍ර කෘතිම බුද්ධි තාක්ෂණය (AI Technology) භාවිතයෙන් නවීකරණය කිරීම සහ පූර්ණ ලෙස ස්වයංක්‍රීයකරණය කිරීමට නිර්දේශ කරන අතර, වරාය සහ ශ්‍රී ලංකා රේගුවේ සහයෝගීතාවයෙන් එක් නිෂ්කාශණ මධ්‍යස්ථානයක් පිහිටුවීම දිරිමත් කිරීමට නිර්දේශ කෙරේ.

- තොග හිමිකරු (ආනයනකරු හෝ අපනයනකරු) සහ රේගු නිලධාරියා අතර ආනයන හා අපනයන නිෂ්කාශන ක්‍රියා පටිපාටිවල ගෙවීම් සිදු කිරීම, අනුමැතිය ලබා දිම සහ තක්සේරු ක්‍රියාවලිය, වාප්පු ලිපිකරුවන්ගේ මැදිහත්වීම ක්‍රමයෙන් අවම කරමින්, සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයකරණය කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- එකම කාර්යය නැවත සිදු කිරිම වළක්වා ගැනිම සඳහා සහ භාණ්ඩ නිෂ්කාශනය වේගවත් කිරීම සඳහා සියළුම රාජ්‍ය ආයතන සම්බන්ධ කිරීම පිණිස ජාතික තනි කවුළුවක් (National Single Window) ක්‍රියාත්මක කිරීම නිර්දේශ කරන අතර ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ගුවන් තොටුපළ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ අනෙකුත් අදාළ බලධාරීන් මේ සඳහා සම්බන්ධ කර ගත හැකිය.

- පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ රථවාහන තදබදය මඟහරවා ගැනීම සඳහා සහ ආනයනය කරනු ලබන දෑ අඩංගු බහාලුම් නිෂ්කාශනය කිරීම සහ අධීක්ෂණය කිරිම වරාය පරිශ්‍රය තුළ සිදු කරනු ලබන බව සහතික කිරීම සඳහා කොළඹ වරාය තුළ කලින් හඳුනාගත් ඉඩමක පොදු බහාලුම් අංගනය ඉදිකිරීම සිදුකළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- 1869 වර්ෂයේ දී හඳුන්වා දුන් රේගු ආඥාපනත යල්පැනගිය එකක් වන බැවින් ඒ වෙනුවට නව නීතිමය පනතක් හඳුන්වා දීමට නිර්දේශ කෙරේ.

- රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ වන්දි අරමුදලට (Reward Fund) බැර කරන මුදල් ප්‍රතිශතය අඩු කිරීමට සහ ඒකාබද්ධ අරමුදලට බැර කරන මුදල් ප්‍රතිශතය වැඩි කිරීමට රේගු ආඥාපනතේ 153 වැනි වගන්තිය සහ අනෙකුත් අදාළ විධිවිධාන සංශෝධනය කිරීමට නිර්දේශ කෙරේ.

- හිතකර වෙළෙඳ පරිසරයක් නිර්මාණය කිරිම සඳහා, රේගුවට අදාළව අධිකරණයේ විභාග වන නඩු සහ අභියාචනා කඩිනම් කිරීමට සහ අභියාචනා සහ පරීක්ෂණ සඳහා වැය වන කාලය අඩු කිරීමට නිර්දේශ කරනු ලබන අතර එම ක්‍රියාමාර්ගය ගබඩා ගාස්තු සහ ප්‍රමාද ගාස්තු අඩු කිරීමට මග පාදනු ඇත.

- නඩු අවසන් කිරීමට සහ බහාලුම්වල අඩංගු භාණ්ඩ බැහැර කිරීමට කඩිනම් පියවර ගනිමින්, රඳවා තබා ගෙන ඇති බහාලුම් අවම වශයෙන් මාස එකහමාරක (1 ½)

සිට මාස තුන (3) දක්වා කාලයක් තුළ නිෂ්කාශනය කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම සඳහා රජය ගෙන ඇති තීරණ මඟින් අපේක්ෂිත අරමුණු ඉටු වන්නේද යන්න සොයා බැලීමට අදාළ පාර්ශවයන්ගෙන් සහ වෘත්තීය ආයතනවලින් ලැබෙන පැමිණිලි විශ්ලේෂණය කිරීමේ යාන්ත්‍රණයක් සැකසීමට නිර්දේශ කෙරේ.

- වරායන්හි සහ ගුවන් තොටුපළවල වැඩ කරන වේලාවන්ට අනුකූලව ශ්‍රී ලංකා රේගුවේ වැඩ කරනු ලබන වේලාවන් සතියේ දින 7 තුළ පැය 24 පුරාම විය යුතු යැයි නිර්දේශ කෙරේ.

- ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන්ගේ කාර්යසාධනය, කාර්යක්ෂමතාවය සහ ඔවුන් විසින් ආදායම් ඉලක්කය සපුරා ගැනීම සමාලෝචනය කිරීම, තක්සේරු කිරීම සහ ඇගයීම සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs), ප්‍රතිඵල ඒකකයක් (delivery unit) සහ ශේෂ ලකුණු කාඩ්පතක් (balanced score card) භාවිතා කරමින් විද්‍යාත්මක අභ්‍යන්තර කාර්යසාධන ඇගයීම් පද්ධතියක් හඳුන්වා දිය යුතු යැයි නිර්දේශ කෙරේ.

- පළපුරුදු තොරතුරු තාක්ෂණ නිලධාරීන් ආයතනය තුළ රඳවා තබා ගැනීම සහතික කිරීමේ අරමුණින් ඉදිරි වසර 5 (2024 - 2029) සඳහා තොරතුරු තාක්ෂණ දැනුම හා විශේෂඥතාව ඇති නිලධාරීන් සඳහා ස්ථාවර ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.

- "ආර්ථිකයේ ඩිජිටල්කරණයෙන් පැන නගින බදු අභියෝග විසඳීම සඳහා කුළුණු දෙකේ විසඳුම පිළිබඳ ප්‍රකාශය" සඳහා ශ්‍රී ලංකාව සම්බන්ධ විය යුතු යැයි නිර්දේශ කෙරේ.

- භාණ්ඩ හා සේවා සඳහා බදු පැනවීමේදී හා සංශෝධනයේදී තොග රැස්කරන්නන් හා ඒකාධිකාරයන් පවත්වා ගන්නන් අධික ලාභ ලැබීම වැළැක්වීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ.

- ASYCUDA පද්ධතිය කාර්යක්ෂමව කළමනාකරණය කර පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය (ICT Directorate) වැඩිදියුණු කිරීමට නිර්දේශ කෙරේ.

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## පසුබිම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් ප්‍රධාන වශයෙන්ම ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද (මූල්‍ය සේවා - එකතු කළ අගය මත බදු ඇතුළුව), ඔට්ටු ඇල්ලීම සහ සූදු බද්ද, මුද්දර බද්ද, උපයන විට ගෙවීම් බද්ද , රඳවා ගැනීමේ බද්ද, සමාජ ආරක්ෂණ දායක බද්ද, ප්‍රාග්ධන බද්ද, ප්‍රේෂණ ගාස්තු සහ කැසිනෝ බලපත්‍ර ගාස්තු එකතු කිරීම පාලනය කිරීම සිදු කරනු ලැබේ.

| බදු වර්ගය | 2022 වසර සඳහා එකතු කළ බදු ආදායම (රු. මිලියන) | 2023 වසර සඳහා රජයේ අපේක්ෂිත බදු ආදායම (රු. මිලියන) | 2023 ජනවාරි සිට ජූනි දක්වා එකතු කරන ලද බදු ආදායම (රු. මිලියන) |
|---|---|---|---|
| ආදායම් බද්ද (ආයතනික හා පුද්ගල ) | 485,901 | 718,000 | 243,842 |
| එකතු කළ අගය මත බද්ද | 292,196 | 553,000 | 230,638 |
| සමාජ ආරක්ෂණ දායක බද්ද | 23,358 | 186,000 | 79,980 |
| උපයන විට ගෙවීම් බද්ද | 25,178 | 100,000 | 70,001 |
| රඳවා ගැනීමේ බද්ද | 19,691 | 90,000 | 68,132 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 2,719 | 4,000 | 654 |
| වෙනත් බදු | 12,178 | 16,013 | 123 |
| මුළු එකතුව | 861,221 | 1,667,013 | 696,367 |

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

2019 වර්ෂයේදී පාස්කු ප්‍රහාරයේ බලපෑම සහ 2020 වසරේදී කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්ත වීම හේතුවෙන් 2019 සහ 2020 වර්ෂයන් තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කළ ආදායම අඩු වී ඇත. එමෙන්ම, 2021 සහ 2022 වසරවලදී රජය විසින් ලබා දෙන ලද බදු සහන හේතුවෙන් එකතු කරන ලද බදු ආදායම අඩු වී ඇත. 2022 වර්ෂයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු. බිලියන 860 ක ආදායමක් එකතු කරන ලද අතර 2023 මුදල් වර්ෂය සඳහා රුපියල් බිලියන 1667 ක ඉලක්කයක් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත. කෙසේ වෙතත්, 2023 වසරේ පළමු අර්ධය සඳහා රුපියල් බිලියන 696 ක ආදායමක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කරනු ලැබ ඇත.

2022.10.01 දින සහ 2023.01.01 දින රජය විසින් හඳුන්වා දුන් පහත සඳහන් ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන්, 2023 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් රුපියල් බිලියන 1667ක ඉලක්කයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදි.

- බදු නිදහස් දීමනාව රු. මිලියන 3 සිට රු. මිලියන 1.2 දක්වා අඩු කිරීම.
- රඳවා ගැනීමේ බද්ද නැවත හඳුන්වා දීම
- උපයන විට ගෙවීමේ බද්ද නැවත හඳුන්වාදීම

- එකතු කළ අගය මත බදු වගකීම් සීමාව රු. මිලියන 300 සිට රු. මිලියන 80 දක්වා අඩු කිරීම
- ආයතනික ආදායම් බදු අනුපාත වැඩි කිරීම
- ප්‍රාග්ධන ලාභ බදු අනුපාතය 10% සිට 30% දක්වා වැඩි කිරීම
- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද හඳුන්වාදීම (2.5%)

2016 වසරේ ක්‍රියාත්මක කරන ලද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුකූලව යාවත්කාලීන කිරීමේ කාර්යය තවමත් සිදු කරනු ලබමින් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විසින් යාන්ත්‍රික නොවන ක්‍රමවේදය (manual) භාවිතයට යොමු වීම පුද්ගලානුබද්ධ තක්සේරුකරණයට මඟ පාදා ඇත.

**නිරීක්ෂණ**

කාරක සභාව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කළේය:

- LEGACY පද්ධතිය යටතේ 2023.06.30 දිනට හිඟ බදු ප්‍රමාණය ආසන්න වශයෙන් රු. බිලියන 7.72 ක් වේ. කෙසේවුවද, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියට (RAMIS) අනුව 2023.06.30 දිනට ලැබිය යුතු හිඟ බදු ආදායම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වාර්තාව ඉදිරිපත් කරන දින වන විටත් කාරක සභාව වෙත ලබා දී නොමැත. (ඇමුණුම III)

- 2022.12.31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි මුළු හිඟ බදු, දණ්ඩන ගාස්තු සහ පොලිය රු. බිලියන 904 ක් විය. ඉහත මුදල එකතු කළ හැකි සහ රඳවා තබා ඇති ලෙස වෙන් කරන ලද විට අගයන් පිළිවෙලින් රු. මිලියන 163,425 ක් සහ රු. මිලියන 740,917ක් විය. (ඇමුණුම IV)

- ඇතැම් වාර්තාවන්ට අනුව විධිමත් ආර්ථිකයෙන් පරිබාහිර ආර්ථික ක්‍රියාකාරකම්වල සැලකිය යුතු කොටසක් සනිටුහන් කරන නියාමනය නොකළ වෙළෙඳපොළ තුළ බදු නොගෙවන්නන්ගෙන් 45% ක් නියාමනය කරනු නොලබන අතර එය බදු ආදායමට සහ සමස්ත ආර්ථික වර්ධනයට බලපෑම් ඇති කරයි.

- ධන බද්ද සහ උරුම බද්ද 2024 වසරේදී හඳුන්වා දීමට නියමිත නව බදු දෙකක් වන අතර මෙම බදු සඳහා නීති සම්පාදනය කිරීම මුදල් අමාත්‍යාංශයට පැවරී ඇත.

- වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුරවැසියන් ආදායම් බදු සඳහා ලියාපදිංචි කිරීම සඳහා වන 2023 අයවැය යෝජනාවට අනුව, ආසන්න වශයෙන් මිලියන 16 ක ජනතාවක් ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලබා ඇති අතර, නිශ්චිත කණ්ඩායම් හඳුනා ගෙන ගැසට් නිවේදනයක් මගින් වෘත්තීය කාණ්ඩවල සුදුසුකම් ලත් කණ්ඩායම් හඳුනා ගැනීම සිදු කර ඇත.

- 2023 අයවැය මගින් ලබා දෙන ලද බදු ලිපිගොනු මිලියන 1.5 ක ඉලක්කයට සාපේක්ෂව, බදු ලිපිගොනු විවෘත කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ඉලක්කය බදු ලිපිගොනු මිලියන 1.2 ක් වේ. කෙසේවුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් මිලියන 1.2 ක බදු ලිපිගොනු විවෘත කිරීම සම්බන්ධයෙන් තවමත් යාන්ත්‍රණයක් හඳුනා ගෙන නොමැත. දැනට යෝජිත ක්‍රමවේදය අනුව මේ සඳහා වසර ගණනාවක් ගතවන බව වාර්තා විය.

- රටේ බදු ප්‍රතිපත්තියේ සිදු කරන ලද අඛණ්ඩ වෙනස්කම් වඩාත් සංකීර්ණ සහ නොගැලපෙන බදු ප්‍රතිපත්තියක් නිර්මාණය වීමට හේතු විය.

- වාර්ෂික අයවැය යෝජනා මගින් රටෙහි බදු ප්‍රතිපත්තියට සිදු කරන ලද වෙනස්කම් හේතුවෙන්, බදු වාර්තා ගොනුව සැලසුම් කිරීමට සැලකිය යුතු කාලයක් ගතවන බැවින්, පුද්ගලයන්ගේ සහ ව්‍යාපාරවල ස්වයං තක්සේරු ලියාපදිංචි කිරීම සෑම වසරකම නොවැම්බර් දක්වා ප්‍රමාද වේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විසින් ආදායම් ඉලක්කය සපුරා ගැනීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා නිසි කාර්යසාධන ඇගයීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවේ.

- සරල කළ අගය මත එකතු කළ බද්ද (SVAT) ප්‍රතිදානයේදී (rebate) ප්‍රමාදයක් සිදුවේ

- බදු ගෙවන්නන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් එකතු කළ අගය මත බදු සඳහා තාවකාලිකව ලියාපදිංචි වූ තාවකාලික එකතු කළ අගය මත බදු ගෙවන්නන් වේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පාලන අධිකාරිය සහ විවිධ ස්ථරවල සේවක පිරිස් අතර මනා සුහදතාවයක් හෝ සම්බන්ධීකරණයක් නොමැති හෙයින් ආයතනික සාමයක් නොපවතී.

ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සම්බන්ධයෙන්, කාරක සභාව විසින් පහත කරුණු නිරීක්ෂණය කරන ලදි:

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS 2.0) නිර්මාණය කර පවත්වාගෙන යන සිංගප්පූරු සමාගම සමඟ ගිවිසුම අලුත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

    - ➢ යෝජිත නව බදුවලට (උරුම බද්ද සහ ධන බද්ද ආදිය) අනුකූලව යාවත්කාලීන කිරීමට
    - ➢ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත අනෙකුත් රාජ්‍ය ආයතන ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය හා අන්තර් සම්බන්ධ කිරීමට
    - ➢ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය තුළ ඒකීය හඳුනාගැනීමේ අංකය ලෙස ජාතික හැඳුනුම්පත් අංකය භාවිත කිරීමේ හැකියාව තිබීම
    - ➢ බදු ලිපිගොනු ලියාපදිංචි කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් වැළැක්වීම සඳහා අවශ්‍ය තාක්ෂණික ධාරිතාවය සහිතව පද්ධතිය වැඩිදියුණු කිරීම

- 2023 සැප්තැම්බර් වන විට ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ සියලුම මොඩියුල නිර්මාණය කිරීමේ කාර්යය අවසන් වනු ඇත.

- 2022.12.31 දිනට රඳවා තබා ගෙන ඇති මුළු හිඟ බදු ප්‍රමාණය තුළ රු. මිලියන 1258 ක ප්‍රමාණයක් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධති දෝෂයක් හේතුවෙන් එකතු වී ඇති බවත් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ දත්ත ඇතුළත් කිරීමේ දෝෂ රාශියක් ඇති බවත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත.

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය කිසිදු අතින් ක්‍රියා කරවන ක්‍රියාවලියකින් තොරව සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය විය යුතුය.

- ගෙවීම පැහැර හැර ඇති බදු මුදල් සමුච්චිත වීම වැළැක්වීමට ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියට හැකියාව තිබිය යුතුය.

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය රාජ්‍ය ආයතන 6 ක් සමඟ අන්තර් සම්බන්ධ කිරීමට මුලින් යෝජනා කරන ලද අතර වර්තමානය වන විට මෙම තොරතුරු පද්ධතිය සමඟ අන්තර් සම්බන්ධ කරනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව 29 ක් දක්වා ඉහළ නංවා ඇත.

- 2024 ජනවාරි 31 වන දින වන විට, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය 2.0 නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා සිංගප්පූරු සමාගම සමඟ එළඹ ඇති ගිවිසුම කල් ඉකුත් වන අතර 2024 ජනවාරි වන විට ආදායම් පරිපාලන

කළමනාකරණ තොරතුරු පද්ධතිය 2.0 හි සම්පූර්ණ වගකීම භාර ගැනීමට දෙපාර්තමේන්තුවේ මානව සම්පත ඇතුළු අභ්‍යන්තර ධාරිතාව සංවර්ධනය කර නොමැත.

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය 2.0 ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ප්‍රධාන ගැටළුව වන්නේ සන්නිවේදන බාධාවන් ය.

- 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බදු පනතට අදාළ කැසිනෝ වැනි ව්‍යාපාරික ආයතන ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය තුළට ඇතුලත් කර නොමැත.

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත දැක්වෙන ස්ථර 3 අතරින් 3 වැනි ස්ථරයේ තාක්ෂණික වශයෙන් නිපුණතාවයක් සහිත පුහුණු නිලධාරීන්ගේ හිඟයක් පවතී.

| | |
|---|---|
| පළමුවැනි ස්ථරය - | සහාය කවුළු / සහාය කණ්ඩායම් (පාරිභෝගිකයන් හා භාවිතා කරන්නන් සඳහා පෙරටුපෙළ සහාය ලබා දීම. ඔවුන් විසින් සිදු කරනු ලබන පොදු දෝෂ නිවැරදි කිරීම, මූලික තාක්ෂණ සහයෝගය ලබා දීම) |
| දෙවන ස්ථරය: | පද්ධති පරිපාලකයන් / ජාල ඉංජිනේරුවරුන් (තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය හා නඩත්තු කිරීමේ වගකීම පැවරී ඇත. වඩාත් සංකීර්ණ තාක්ෂණ ගැටළු විසඳීම, වින්‍යාසය (configuration), සේවාදායකය (server) හා ජාල නඩත්තුව) |
| තුන්වන ස්ථරය: | නිර්මාපකයන් / විශේෂඥ ඉංජිනේරුවරුන් අඛණ්ඩ ඒකාබද්ධ කිරීම, අඛණ්ඩ යෙදවීම (CI/CD), අඛණ්ඩ අනුකලනය, ස්වයංක්‍රීයකරණය සහ පද්ධති කාර්යසාධනය ප්‍රශස්ථකරණය |

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියට බදු දත්ත උඩුගත කිරීමේ ප්‍රමාදයක් පවතී.

- නිර්මාපක, වැඩසටහන්කරු සහ පරිශීලක යන සියල්ලන්ම සිටිනා පසු මෙහෙයුම් කාර්යාලයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතුව නොමැත.

## නිර්දේශ

- වසර තුනක් ඇතුළත එකතු කළ හැකි (collectable) සහ රඳවා තබා ඇති (Held over) බදු එකතු කර අවසන් කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- වයස අවුරුදු 18 සම්පූර්ණ කරන සෑම පුරවැසියෙකුටම බදු ලිපිගොනු විවෘත කිරීමට අවශ්‍ය කරන තොරතුරු රැස් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2024 වර්ෂයේදී පැවැත්වීමට නියමිත සංගණනය සමඟ සම්බන්ධ විය යුතු යැයි නිර්දේශ කෙරේ. එමෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරාමිතීන් සැපයීමට සහ අවශ්‍ය නීති සංශෝධනයන් සිදු කිරීමට නිර්දේශ කෙරේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන ආදායම් බදු තක්සේරුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තු තක්සේරුකරුවන්ගේ පුද්ගලානුබද්ධ මැදිහත්වීමකින් තොරව මාර්ගගතව සිදු කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- අවිධිමත් ආර්ථිකය නියාමනය කිරීම සහ බදු ආදායම වැඩි කිරීම සඳහා සියලු මූල්‍ය ගනුදෙනු ග්‍රහණය කර ගැනීම සඳහා, ඒකීය හඳුනාගැනීමේ අංකයක් (unique identification number) හඳුන්වා දීමට නිර්දේශ කෙරේ.

- සියලුම ආර්ථික ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සඳහා, අවසාන ඉන්වොයිසියක් සහ කුවිතාන්සියක් හරහා සියලුම විකුණුම් සිදු කිරීම අනිවාර්ය කිරීම මඟින්, නියාමනය නොකළ වෙළඳපල සම්පූර්ණයෙන් නියාමනය කිරීමට නිර්දේශ කෙරේ.

- බැංකු සමඟ අන්තර් සම්බන්ධිතව ස්වයංක්‍රීය ඉන්වොයිසි ක්‍රමයක් (automated invoice system) හඳුන්වා දිය යුතු බවට නිර්දේශ කර ඇති අතර මෙය අවසානයේදී රජයට, බදු ගෙවන්නන්ට සහ සමස්ත ආර්ථිකයට ප්‍රතිලාභ ලබා දෙනු ඇත. බදු ගෙවන්නන්ට ඔවුන්ගේ බදු වගකීම් නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම පහසු කිරීම මගින් බදු නීතිවලට අනුකූල වීම වැඩිදියුණු කළ හැකිය .

- බදු නොවන ගෙවීම් සඳහා මුදල් ගනුදෙනු සීමාවක් හඳුන්වා දීමට නිර්දේශ කෙරේ: බදු සඳහා ලියාපදිංචි වී නොමැති සියලුම පුද්ගලයන් අවසාන ඉන්වොයිසිය/රිසිට්පතක් හරහා යම් අගයකට වඩා වැඩි ගනුදෙනු සිදු කිරීමට අවශ්‍ය වේ.

- වාණිජ ව්‍යාපාර ලියාපදිංචි කිරීම සඳහා ඒකීය හඳුනාගැනීමේ අංකයක් නිකුත් කිරීම අනිවාර්ය කළ යුතු යැයි නිර්දේශ කෙරේ. සෞඛ්‍ය සේවා, අධ්‍යාපන සේවා හා නීති සමාගම් තම ව්‍යාපාර ආරම්භ කරන විට අදාල බලධාරීන් වෙත ලියාපදිංචි විය යුතු යැයි නිර්දේශ කෙරේ.

- ශ්‍රී ලංකාවේ ඉපදුණු හා අධ්‍යාපනය ලැබූ යම් පුරවැසියෙකු වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විට එම තොරතුරු මාර්ගගත වේදිකාවක් හරහා යාවත්කාලීන කිරීමට දීපව්‍යාප්ත යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතු යැයි නිර්දේශ කෙරේ.

- වාර්ෂික අයවැයෙන් අවම වෙනස්වීම් සහතික කෙරෙන නියත බදු ප්‍රතිපත්තියක් හඳුන්වා දිය යුතු යැයි නිර්දේශ කෙරේ.

- බදු ගෙවන්නන් සඳහා විද්‍යුත් ගොනු කිරීම (e-filing) සක්‍රීය කරමින් සෑම වසරකම ජූනි 1 වන දින වන විට ස්වයං තක්සේරු ලියාපදිංචිය විවෘත කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- අපනයනකරුවන් මුහුණ දෙන දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා සරල කළ අගය මත එකතු කළ බද්ද (SVAT) ප්‍රතිදානය (rebate) සඳහා නිශ්චිත දිනයක් තීරණය කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව සහ කාර්යසාධනය තක්සේරු කිරීමේ අරමුණින් ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) හඳුන්වා දීමට නිර්දේශ කෙරේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කාර්යසාධනය, කාර්යක්ෂමතාව සහ සඵලතාවය සමාලෝචනය කිරීමට, තක්සේරු කිරීමට සහ ඇගයීමට ප්‍රතිඵල ඒකකයක් (delivery unit) සහිත ශේෂ ලකුණු කාඩ්පතක් (balanced score card) භාවිතා කරමින්, කාර්යසාධනය පිළිබඳ විද්‍යාත්මක ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු යැයි නිර්දේශ කරන අතර එය මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ඩැෂ් පුවරුවක් (Dashboard) මගින් නිරීක්ෂණය කිරීමට හැකියාව ලබා දිය යුතුය.

- බදු ආදායම කාන්දු වීමට හේතු වන බැවින් තාවකාලිකව එකතු කළ අගය මත බදු ගෙවන්නන්ගේ ප්‍රමාණය අඩු කළ යුතු යැයි නිර්දේශ කරන අතර මේ සම්බන්ධයෙන් අදාළ නීති සංශෝධන සිදු කිරීමට නිර්දේශ කෙරේ.

- කැසිනෝ ව්‍යාපාරවල ආදායම නිවැරදි ලෙස තක්සේරු කිරීම මඟින් 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත යටතේ එම ව්‍යාපාර නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා නියාමන අධිකාරියක් පිහිටුවීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වැදගත් කාර්යභාරයක් ඉටුකළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- ඉදිරි වසර 5 සඳහා (2024 - 2029) තොරතුරු තාක්ෂණ දැනුම සහ විශේෂඥතාව ඇති නිලධාරීන් සඳහා නියත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා සේවය කිරීමට හිතකර පරිසරයක් ආයතනය තුළ සහතික කිරීමට නිර්දේශ කෙරේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බදු ආදායම වැඩි කිරීම, උද්ධමනය හා බදු ප්‍රතිපත්ති සම්බන්ධ ක්‍රමවේද පිළිබඳ නිපුණතාවය ලබා තිබිය යුතු යැයි නිර්දේශ කෙරේ.

ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සම්බන්ධයෙන් පහත නිර්දේශ ඉදිරිපත් කරන ලදී:

- ශ්‍රී ලංකා ඒකීය ඩිජිටල් අනන්‍යතාවය (SLUDI) ක්‍රියාත්මක වීමෙන් පසු ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි ඒකීය හඳුනාගැනීමේ අංකය ලෙස ශ්‍රී ලංකා ඒකීය ඩිජිටල් අනන්‍යතාවය (SLUDI) යොදා ගැනීමට නිර්දේශ කෙරේ.

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය 2.0 හි සම්පූර්ණ වගකීම භාර ගැනීමට 3 වැනි ස්ථරයේ තාක්ෂණික වශයෙන් නිපුණතාවය ඇති සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගත යුතු යැයි නිර්දේශ කෙරේ.

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) යොදාගනිමින්, පසු මෙහෙයුම් කාර්යාලය (Back Office) පවත්වාගෙන යාමට සහ පද්ධතිය නඩත්තු කිරීමට අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වැඩපිළිවෙලක් නිර්දේශ කෙරේ. (තොරතුරු තාක්ෂණ නිලධාරීන් විසින් වැඩි වැටුප් ඉල්ලා සිටීමේ ගැටලුව ජය ගැනීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ආකෘතිය දිරිමත් කරනු ලැබේ) .

- තොරතුරු තාක්ෂණ පද්ධතියට උඩුගත කරන ලද දත්තවල දෝෂ හේතුවෙන් වෙනස්කම් ඇති විය හැකි බැවින්, මූලාශ්‍රයෙන් (source) දත්ත රැස් කිරීමට නිර්දේශ කෙරේ.

- වසරක කාලපරිච්ඡේදය ඇතුලත බදු ලිපිගොනු විවෘත කිරීම සඳහා දත්ත උඩුගත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට නිර්දේශ කෙරේ. දැනට 2018 වසරේ දත්ත ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙත ඇතුලත් කරනු ලබන අතර බදු ලිපිගොනු විවෘත කිරීමේදී නවතම දත්ත මගින් පද්ධතිය යාවත්කාලීන කළ යුතුයි.

- අතින් ක්‍රියාකරවීමෙන් තොරව (manual) ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය සම්පූර්ණ ස්වයංක්‍රීයව ක්‍රියාත්මක විය යුතු යැයි නිර්දේශ කෙරේ.

- පැහැර හරිනු ලැබ ඇති බදු මුදල (default tax) සමුච්චිත වීම වැලැක්වීමට ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියට පහසුකම් ඇති කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම සඳහා සිය නිලධාරීන් සූදානම් කිරීම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ඈඩාංග මන්දගාමී වන බැවින් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය 2.0 භාවිතයේ යෙදවීම අභ්‍යන්තර සැකසුම් ද (internal processing) සමඟ සම්පූර්ණ කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

**පසුබිම**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කරමින් ආදායම් කළමනාකරණය, නීතිය ක්‍රියාත්මක කිරීම සහ සමාජ ආරක්ෂණය සඳහා දායක වේ.

- සියලුම සුරාබදු බලපත්‍රලාභී පරිශ්‍ර අධීක්ෂණය, පාලනය සහ ඒවායේ ආදායම් එකතු කිරීම
- (52 වන අධිකාරය) 1912 අංක 8 දරන සුරාබදු ආඥාපනත සහ 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත කාර්යක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.
- 1929 අංක 17 දරන විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.
- ජාතියේ සමාජ ආරක්ෂාව සඳහා 2006 අංක 27 දරන දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම.
- 2008 අංක 1 දරන මත්ද්‍රව්‍ය හා මනෝ ප්‍රතිකාරක ඖෂධ නීතිවිරෝධී ජාවාරමට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක කිරීම.

භාණ්ඩාගාරය විසින් 2023 වර්ෂය සඳහා රුපියල් බිලියන 217 ක ආදායම් ඉලක්කයක් ලබා දී ඇති අතර, 1912 අංක 8 දරන සුරාබදු ආඥාපනත, 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත සහ 2006 අංක 27 දරන දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය වැනි නීති බලාත්මක කිරීම මගින් අපරාධ හඳුනාගැනීම් 40000 ක ඉලක්කයක් ද ලබාදී ඇත. රු. බිලියන 217 ක ඇස්තමේන්තුගත ආදායම රු. බිලියන 214 ක් සුරාබදු ආදායම ලෙසත් රු. බිලියන 3 ක් දුම්කොළ ආදායම ලෙසත් බෙදා දැක්විය හැක.

| ආදායම් වර්ගය | 2022 වර්ෂය සඳහා එකතු කරන ලද බදු ආදායම (රු. බිලියන) | 2023 වර්ෂය සඳහා අපේක්ෂිත ආදායම (රු. බිලියන) | 2023 වර්ෂයේ ජනවාරි සිට ජූනි මස දක්වා එකතු කරන ලද බදු ආදායම (රු. බිලියන) |
|---|---|---|---|
| සුරා බදු අදායම | 169.4 | 214 | 88.6 |
| දුම්කොල බදු ආදායම | 0.042 | 3 | 0.363 |
| එකතුව | 169.44 | 217 | 88.963 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ඉස්කාගාර සමාගම (DCSL) (44%) සහ ලයන් බෲවරි ආයතනය (28.7%) ලෙස සුරාබදු දෙපාර්තමේන්තුවට ප්‍රධාන ආදායම් දායකත්වය සපයන අතර ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි මත්පැන් නිෂ්පාදන කර්මාන්තශාලා සංඛ්‍යාව 23 ක් වේ.

පාස්කු ප්‍රහාරයේ බලපෑම, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සංචාරක කර්මාන්තයේ බිඳවැටීම, ආර්ථික හා දේශපාලන අර්බුදය, උද්ධමනය වැඩිවීම සහ ඇමෙරිකානු ඩොලර් අනුපාතය ඉහළ යාම, නීත්‍යානුකූල මත්පැන් සඳහා ඇති ඉල්ලුම අඩුවීමට බලපාන ප්‍රධාන සාධක වන අතර ජනතාව අතර නීතිවිරෝධී මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ.

## නිරීක්ෂණ

කාරක සභාව පහත කරුණු නිරීක්ෂණය කරන ලදී:

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ 2023.06.30 දිනට එකතු කිරීමට ඇති හිඟ බදු මුදල වන්නේ ආසන්න වශයෙන් රු. මිලියන 6235.9 කි. (ඇමුණුම V)

- බදු ගෙවන්නන් විසින් ගෙවීමට ඇති හිඟ බදු පියවීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් සැලැස්මක් ඉදිරිපත් කර ඇත.

- මත්පැන් බලපත්‍රලාභීන් විසින් නියමිත දිනට මත්පැන් බලපත්‍ර සඳහා ගෙවිය යුතු බදු නොගෙවන විට මත්පැන් බලපත්‍ර අවලංගු කිරීමට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව පසුබට වේ.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ඩිජිටල්කරණය කර නොමැති අතර විද්‍යුත් සේවා සපයන මෘදුකාංග පද්ධතියක් නොමැති වීම සහ මාර්ගගත ආදායම් පරිපාලන ක්‍රමයක් නොමැති වීම කැපී පෙනේ.

- 2023 ජනවාරි මස සිට ජූනි මස දක්වා මාස 6 ක කාලය සඳහා දෙපාර්තමේන්තුව විසින් ඉලක්කගත සුරාබදු ආදායම වන රු. බිලියන 214 න් රු. බිලියන 88.6 ක් සහ ඉලක්කගත දුම්කොළ ආදායම වන රු. බිලියන 3 න් රු. මිලියන 363 ක් ද එකතු කොට ඇත. 2023 ජනවාරි සිට ජූනි දක්වා කාල පරිච්ඡේදය තුළ ඉලක්කගත සුරාබදු ආදායමෙන් අඩක්වත් එකතු කර ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී ඇත.

- බදු වැඩි කිරීම හේතුවෙන් නිෂ්පාදනයේ මිල ඉහළ යාම සහ ඉල්ලුම සහ පරිභෝජනය අඩු වීම හේතුවෙන් සුරාබදු ආදායම අඩු වී ඇත.

- සුරාබදු වැඩි කිරීමේදී, මිල නම්‍යතාවය පිළිබඳව සලකා බලා නොමැත.

- ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රාව (Fake security tax stamp) සහිත මත්පැන් බෝතල් හේතුවෙන් රට තුළ සංසරණය වන නීතිවිරෝධී මත්පැන්වල ඉහළ යාමක් දක්නට ලැබේ.

- ආරක්ෂිත බදු මුද්‍රාව සැබෑ හෝ ව්‍යාජ මත්පැන් නිෂ්පාදන හඳුනාගැනීම සඳහා භාවිතා කරන ක්‍රමයක් ලෙස සැලකේ

- මත්පැන් නිෂ්පාදන සමාගම් නිෂ්පාදනය කරනු ලබන මත්පැන් හඳුනා ගැනීම සඳහා සියළු මත්පැන් නිෂ්පාදන සමාගම් සඳහා සමජාතීය හඳුනාගැනීමේ පද්ධතියක් නොමැත. අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් ප්‍රකාරව ශ්‍රී

ලංකා ඉස්කාගාර සමාගම, ලයන් බෲවරි සමාගම, මාවතගම හයින්කෙන් සමාගම සහ ශ්‍රී ලංකා ඉස්කාගාර සමාගමේ අනුබද්ධිත සමාගමක් යන මත්පැන් නිෂ්පාදන සමාගම් හතරක් ඩිජිටල් කේත ක්‍රමය භාවිතා කරන අතර අනෙකුත් සියලුම මත්පැන් නිෂ්පාදන සමාගම් මත්පැන් බෝතල්වල ආරක්ෂිත බදු මුද්‍රාව භාවිතා කරයි. ශ්‍රී ලංකා ඉස්කාගාර සමාගම සහ අනෙකුත් සමාගම් තුන ඔවුන් විසින් නිෂ්පාදනය කරනු ලබන විශාල මත්පැන් ප්‍රමාණය හේතුවෙන් නිෂ්පාදනය කරනු ලබන මත්පැන් බෝතල්වල ආරක්‍ෂිත බදු මුද්‍රාව භාවිතා කිරීමට අපහසු බව ප්‍රකාශ කරයි.

- ව්‍යාජ මත්පැන් හා මධ්‍යසාර නිෂ්පාදන වැළැක්වීම හා බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම මගින් බදු ආදායම ඉහළ නැංවීමේ අරමුණින් මත්පැන් බෝතල්වල ඩිජිටල් රූප මුද්‍රණය හෝ කඩදාසි මත මුද්‍රණය කරන ලද ස්ටිකර් භාවිතා කිරීමට හැකි වන ලෙස 2021.02.22 දිනැතිව අංක 21/0335/304/031 දරන "ස්ටිකර් සහ ස්ටිකර් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත.

- මාස 6ක කාලයක් ඇතුළත ආරක්ෂිත බදු මුද්‍රාව භාවිත කිරීමේ ක්‍රමයට පරිවර්තනය වීමට ශ්‍රී ලංකා ඉස්කාගාර සමාගම කටයුතු කරනු ඇත.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මහජනතාවට හඳුන්වා දී ඇති බදු මුද්‍රා වලංගුකාරකය (ජංගම යෙදුම) මගින් අනාවරණය කරගත හැක්කේ නිෂ්පාදන සමාගමේ නම, නිෂ්පාදනයේ නම සහ පරිමාව වැනි පූර්ව නිශ්චිත තොරතුරු පමණි. එයට ආරක්ෂිත බදු මුද්‍රාවේ සත්‍යතාව හඳුනාගත නොහැක. එය තොරතුරු සොයාගැනීමේ අරමුණ සඳහා පමණක් භාවිතා වේ.

- මෙම ආරක්ෂිත බදු මුද්‍රාවෙහි විවෘත, සංවෘත සහ වෝහාරික යනුවෙන් විශේෂාංග තුනක් ඇත.
  - විවෘත විශේෂාංගය මගින් පියවි ඇසින් ආරක්ෂිත බදු මුද්‍රාවේ සත්‍යතාවය හඳුනා ගත හැක.
  - සංවෘත විශේෂාංගය මඟින් විශේෂ උපාංග භාවිතයෙන් ආරක්ෂිත බදු මුද්‍රාවේ සත්‍යතාවය හඳුනා ගැනීමට හැකියාව ලැබේ.
  - වෝහාරික විශේෂාංගය හරහා ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රා හඳුනා ගැනීම සඳහා විද්‍යාත්මක ක්‍රම සහ ශිල්පීය ක්‍රම යෙදීම අත්‍යවශ්‍ය වේ.

- ආරක්ෂිත බදු මුද්‍රාවක් මුද්‍රණය කිරීම සඳහා වැය වන මුදල රුපියල් 1.80 ක් පමණි.

- බදු මුද්‍රා වලංගුකාරකය (ජංගම යෙදුම) භාවිතයෙන් ආරක්‍ෂිත බදු මුද්‍රාවේ සත්‍යතාවය හඳුනාගත හැකි වන පරිදි ආරක්‍ෂිත විශේෂාංග එකතු කරමින් ආරක්‍ෂිත බදු මුද්‍රාව සංවර්ධනය කෙරෙමින් පවතී.

- ඉන්දියාවේ මැඩ්රාස් සෙකියුරිටි ප්‍රින්ටර්ස් සමාගම විසින් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආරක්‍ෂිත බදු මුද්‍රාවේ සත්‍යතාවය හඳුනාගැනීම සඳහා ස්කැනින් උපාංග 200 ක් සහ UV ලයිට් 40ක් ලබා දී ඇති අතර මෙම උපාංග ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් භාවිත කරනු නොලැබේ. මෙම උපකරණ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත භාරදීමේදී උපාංගය සමඟ භාවිතා කිරීම සඳහා වන යෙදුම තමන්ට සපයා නොමැති බවට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීහු මැසිවිලි නගති.

- විවෘත සහ සංවෘත ක්‍රමවලින් අනාවරණය කර ගත නොහැකි ආරක්ෂිත බදු මුද්‍රාවේ සත්‍යතාවය හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව තුළ අධිකරණ වෛද්‍ය ඒකකයක් ස්ථාපිත කෙරෙමින් පවතී.

- ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රා සහිත මත්පැන් බෝතල් විකුණන සිල්ලර වෙළඳසැල්වලට සහ එවැනි ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රා සහිත මත්පැන් බෝතල් නිෂ්පාදනය කරනු ලබන මත්පැන් නිෂ්පාදකයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇත.

- මත්පැන් නිෂ්පාදනාගාර 23 තුළ සුරාබදු නිලධාරීන් සිටියත් මත්පැන් නිෂ්පාදනය අධීක්ෂණය කිරීමට සහ ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රා සහිත මත්පැන් බෝතල් සොයා ගැනීමට නිසි යාන්ත්‍රණයක් නොමැත.

- මාර්ගගත ක්‍රමය ඔස්සේ මත්පැන් අලෙවි කිරීම සහ මත්පැන් නිෂ්පාදකයින් විසින් මත්පැන් සිල්ලර වෙළඳාමේ නියැලීම රජයට අයවිය යුතු බදු ගෙවීම පැහැර හැරීමට හේතු වේ.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් බොහෝ මත්පැන් අලෙවිසැල් වටලා ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රා සහිත මත්පැන් බෝතල් සුවිශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන ඇත.

- දිස්ත්‍රික්කයක් තුළ එක් පුද්ගලයෙකුට මත්පැන් විකිණීම සඳහා ලබා දිය හැකි බලපත්‍ර ප්‍රමාණය දෙකක් පමණක් වුවද බලපත්‍ර දෙකකට වඩා ලබා දීමට සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට ලබා දී ඇති අභිමතය මෙම කර්මාන්තයේ ඒකාධිකාරයක් ඇති කිරීමට සහ රාජ්‍ය ආදායම අහිමි වීමට හේතු වී ඇත.

- මත්පැන් නිෂ්පාදනය කරනු ලබන දින සිට බදු ගෙවීමට දින පහළොවක කාලයක් මත්පැන් නිෂ්පාදකයින්ට ලබා දී ඇති අතර එමඟින් නොගෙවූ බදු විශාල ප්‍රමාණයක් එකතු වේ.

- මාර්ගගත ක්‍රමය ඔස්සේ මත්පැන් අලෙවි කිරීම හේතුවෙන් වයස අවුරුදු 21 ට අඩු දරුවන්ට මත්පැන් මිලදී ගැනීම සඳහා ඉඩකඩ සලසයි.

- එතනෝල්, කර්මාන්ත සඳහා භාවිතා කරන අමුද්‍රව්‍යයක් වන මෙතනෝල් ලෙස ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබයි.

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන කෘතිම රා ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාලේඛන ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතුව නොමැත.

- අපද්‍රව්‍ය ලෙස බැහැර කරනු ලබන පෙරන ලද ස්ප්‍රීතු භාවිතා කර මත්පැන් නිෂ්පාදනය කිරීම බදු ගෙවීම පැහැර හැරීමට හේතුවේ.

- රා සඳහා ප්‍රමිතීන් සැකසීමේ ක්‍රියාවලිය කාර්මික තාක්ෂණායතනය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සහ පොල් පර්යේෂණායතනය යන ආයතන පහ මගින් සිදු කෙරේ.

- ස්වභාවික රා වලින් කෘතිම රා විද්‍යාත්මකව වෙන්කර හඳුනා ගැනීමට කිසිදු තාක්ෂණික ක්‍රමවේදයක් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතුව නොමැත.

- පවතින ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ජනතාව උපයන අඩු ආදායම හේතුවෙන් සෞඛ්‍යයට අහිතකර නීතිවිරෝධී මත්පැන් වැඩිපුර පරිභෝජනය කිරීමට ජනතාව පෙළඹේ.

- සුරාබදු නිලධාරීන් ආදායම් ඉලක්කයට ළඟා වීම නිරීක්ෂණය කිරීමට නිසි ක්‍රමවේදයක් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතුව නොමැත.

## නිර්දේශ

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට සම්බන්ධිත අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධ කිරීමේ හැකියාව ඇති පූර්ණ ස්වයංක්‍රීය ආදායම් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මඟින් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ඩිජිටල්කරණයට සහ නවීකරණය කිරීමට නිර්දේශ කෙරේ.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි මත්පැන් බලපත්‍රලාභීන් 5000 ක් සහ මත්පැන් නිෂ්පාදන කර්මාන්ත ශාලා 23 ක් නිරීක්ෂණය කිරීමට නිසි යාන්ත්‍රණයක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා පහත සඳහන් සංරචක ඇතුළත් තොරතුරු තාක්ෂණ යෙදුමක් සංවර්ධනය කිරීම කඩිනම් කිරීමට නිර්දේශ කෙරේ:
  - මත්පැන් නිෂ්පාදන සමාගම් 23 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ කිරීම
  - මත්පැන් නිෂ්පාදන සමාගම් 23 හි දෛනික මත්පැන් නිෂ්පාදනය සහ එම නිෂ්පාදනයට ගණනය කළ බදු ප්‍රමාණය නිරීක්ෂණය කිරීම සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට ඩෑෂ් පුවරුවක් (Dashboard) ලබාදීම.
  - නිෂ්පාදන ක්‍රියාවලිය අවසන් වූ වහාම බදු ගණනය කළ හැකි ස්වයංක්‍රීය බදු ක්‍රමයක් හඳුන්වා දීම
  - මාර්ගගත ක්‍රමය ඔස්සේ මත්පැන් බලපත්‍ර වාර්ෂිකව අලුත් කිරීමේ පහසුකම් ලබා දීම
  - බදු ගෙවීම පැහැර හරින විට ස්වයංක්‍රීයව මත්පැන් බලපත්‍ර අවලංගු කිරීමේ පහසුකම ලබා දීම

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මත්පැන් බලපත්‍ර පහත සඳහන් අවස්ථාවලදී අවලංගු කිරීම සඳහා මිණුම් සලකුණු (benchmarks) හඳුන්වා දීමට නිර්දේශ කෙරේ:
  - සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය) 27 (1) (අ) වගන්තිය අනුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ගෙවීම් සැලැස්මේ නියම කර ඇති කාල සීමාව තුළ මත්පැන් බලපත්‍රලාභීන් විසින් මත්පැන් බලපත්‍ර සඳහා බදු නොගෙවන විට
  - ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රා සහිත මත්පැන් බෝතල් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම

- මත්පැන් නිෂ්පාදන බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව වැඩි කිරීමට නිර්දේශ කෙරේ.

- මත්පැන් නිෂ්පාදන සමාගම් 23ම ආරක්ෂිත බදු මුද්‍රාව භාවිතා කරන එක් සමජාතීය හඳුනාගැනීමේ ක්‍රමයක් අනුගමනය කළ යුතු බවට නිර්දේශ කෙරේ.

- ව්‍යාජ ආරක්ෂිත මුද්‍රාව සහිත මත්පැන් බෝතල් හඳුනාගැනීමේ අභියෝගයට මුහුණ දීම සඳහා සහ සැපයුම් දාමය පුරා බෝතල් බෙදාහැරීම නිරීක්ෂණය කිරීම සඳහා උසස් ආරක්ෂිත විශේෂාංග සහිත මධ්‍යගත මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ. (මෙය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතියක් (PPP model) භාවිතා කරමින් තෙවන පාර්ශවයක් හරහා සිදු කළ යුතුය)

- ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රාව හඳුනාගැනීම සඳහා දැඩි ආරක්ෂිත විශේෂාංග සහිත ජංගම යෙදුමක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමටත් ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රාව සහිත මත්පැන් බෝතල් හඳුනාගැනීම සඳහා QR කේත ක්‍රමය පදනම් කරගත් තාක්ෂණයක් හඳුන්වා දීමට නිර්දේශ කරන අතර එම මුද්‍රාව පහසුවෙන් හඳුනා ගැනීමේ හැකියාව පාරිභෝගිකයාට සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට තිබිය යුතුය. ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රාව හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දෙනු ලබන ක්‍රමවේදයට සියළු මත්පැන් නිෂ්පාදනාගාර ඇතුළත් කිරීමට පියවර ගැනීමටත් නිර්දේශ කෙරේ.මේ පිළිබඳව පවතින නෛතික ප්‍රතිපාදනවල අපැහැදිලිතාවය තුරන් කිරීමට නිර්දේශ කෙරේ.

- දිවයින පුරා පිහිටි මත්පැන් නිෂ්පාදන සමාගම් 23 හි කැමරා සම්බන්ධ කර නිරීක්ෂණය කළ හැකි මෙහෙයුම් මැදිරියක් ස්ථාපිත කිරීමට නිර්දේශ කෙරේ.

- මාර්ගගත ක්‍රමය ඔස්සේ මත්පැන් අලෙවිය තාවකාලිකව නතර කිරීමටත්, බදු එකතු කිරීම සහතික කෙරෙන මාර්ගගත ක්‍රමය හරහා මත්පැන් අලෙවිය පිළිබඳ නිසි නියාමනයක් සමඟින් එය නැවත හඳුන්වා දීමටත් නිර්දේශ කෙරේ.

- බදු එකතු කිරීම සහතික කරමින් මත්පැන් නිෂ්පාදකයින් විසින් මත්පැන් සිල්ලර ලෙස අලෙවි කිරීම නියාමනය කිරීමට නිර්දේශ කෙරේ.

- එක් දිස්ත්‍රික්කයක් සඳහා එක් පුද්ගලයෙකුට / පුද්ගලික ආයතනයකට ලබා දිය හැකි මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව සීමා කරමින් මත්පැන් බලපත්‍ර ලබාදීම නියාමනය කිරීමට නිර්දේශ කෙරේ.

- ව්‍යාජ ආරක්ෂිත මුද්‍රාව සහිත මත්පැන් බෝතල් ප්‍රමාණය සහ රට තුළ සංසරණය වන නීති විරෝධී මත්පැන් ප්‍රතිශතය පිළිබඳ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව මගින් සමීක්ෂණයක් සිදු කිරීමට නිර්දේශ කෙරේ.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව මගින් මත්පැන්වල මිල ඉහළ යාම සහ නීතිවිරෝධී මත්පැන් භාවිතයේ ප්‍රවණතාවය අතර සහසම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීමට නිර්දේශ කෙරේ.

- දුම්වැටි සහ මත්පැන් සඳහා මිනිසුන් ඇබ්බැහි වීමෙහි සමාජීය පිරිවැය තීරණය කිරීම සඳහා ජනතාගේ දුම්වැටි සහ මත්පැන් භාවිතය සහ ඇබ්බැහිවීම් පිළිබඳ දත්ත සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ බෙදා ගැනීමට නිර්දේශ කෙරේ.

- ආදායම් ඉලක්ක සපුරා ගැනීම, කාර්යසාධනය සහ කාර්යක්ෂමතාවය අත්පත් කර ගැනීම අධීක්ෂණය කෙරෙන ප්‍රතිඵල ඒකකයක් (delivery unit) සහිත ශේෂ ලකුණු කාඩ්පතක් (balanced score card) භාවිතා කරනු ලබන විද්‍යාත්මක අභ්‍යන්තර ඇගයීම් පද්ධතියක් සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) සුරාබදු නිලධාරීන් සඳහා හඳුන්වා දීමට නිර්දේශ කෙරේ.

- පළපුරුදු තොරතුරු තාක්ෂණ නිලධාරීන් රඳවා තබා ගැනීම සහතික කිරීමේ අරමුණින් ඉදිරි වසර 5ක කාලය (2024 - 2029) සඳහා තොරතුරු තාක්ෂණ දැනුම සහ විශේෂඥතාව ඇති නිලධාරීන් සඳහා නියත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.

# ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතිය

**පසුබිම**

රාජ්‍ය ආයතනවල වත්මන් භාවිතයන් සහ ක්‍රියා පටිපාටි තුළින් ව්‍යාපාර සඳහා අවහිරතා ඇති කරන බැවින්, ව්‍යාපාර කිරීමේ පහසුව ඇති කරන අතරම ආදායම් අහිමිවීයාම් අවම කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සහාය ඇතිව තොරතුරු තාක්ෂණ පද්ධති හඳුන්වා දීම මඟින් රාජ්‍ය ආයතනවල උපරිම කළමනාකරණ කාර්යක්ෂමතාව සහතික කිරීමේ දැඩි අවශ්‍යතාවයක් මතු වී ඇත.

ඒ අනුව පහත සඳහන් රාජ්‍ය ආයතන 13 සමඟ ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීමට යෝජනා කරන ලදී:

1. මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
2. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
3. ශ්‍රී ලංකා රේගුව
4. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
5. සෞඛ්‍ය අමාත්‍යාංශය, ආහාර පාලන පරිපාලන ඒකකය
6. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
7. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
8. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
9. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
10. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
11. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
12. කොළඹ මහ නගර සභාව
13. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

**නිරීක්ෂණ**

ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතිය පිළිබඳව කාරක සභාව පහත කරුණු නිරීක්ෂණය කරන ලදී:

- රාජ්‍ය ආයතන 13ක් සමඟ ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතිය සම්බන්ධ වීම ප්‍රමාද වීමට හේතු වන ප්‍රධාන කරුණු දෙකක් ලෙස අදාළ ආයතන තුළ තාක්ෂණික සූදානමක් සහ නීතිමය සූදානමක් නොමැතිකම හඳුනා ගන්නා ලදී.

- මෙම රාජ්‍ය ආයතනවල තොරතුරු තාක්ෂණ පද්ධති ඒකාබද්ධ කිරීමට ඇති එක් ප්‍රධාන බාධාවක් වන්නේ මෙම රාජ්‍ය ආයතන 13 ටම අදාළ කර ගත හැකි ඒකීය හඳුනාගැනීමේ අංකයක් නොමැති වීමයි.

- ඉහත රාජ්‍ය ආයතන 13 ට අමතරව තවත් රාජ්‍ය ආයතන මෙම ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතියට සම්බන්ධ කළ යුතුය.

- එක් එක් ආයතනවල තොරතුරු තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම මගින් එක් එක් ආයතනය විසින් සලසනු ලබන සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ හැකියාව පවතී.

- සන්නිවේදනය සහ ගනුදෙනු අන්තර්ජාලය හරහා සිදු කරන විට විනිවිදභාවය සාපේක්ෂව ඉහළ ය.

- විද්‍යුත් ගෙවීම් ක්‍රම, අනෙකුත් ගෙවීම ක්‍රමවලට සාපේක්ෂව පහසු, ඵලදායී සහ කාලය ඉතිරි කරවන සුළු වෙයි.

- රාජ්‍ය ආයතනවල තොරතුරු තාක්ෂණ පසු මෙහෙයුම් කාර්යාලය කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය හොඳම විසඳුම ලෙස දැක්විය හැක.

- ආයතනය සඳහා සකස් කරන ලද තොරතුරු තාක්ෂණ පද්ධති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව සම්පත බොහෝ රාජ්‍ය ආයතනවලට නොමැත.

- වෙනත් රාජ්‍ය ආයතන සමඟ දත්ත හුවමාරු කර ගැනීමට නීතිමය බාධාවන් පවතී.

## නිර්දේශ

- දැනට යෝජිත ආයතනවලට අමතරව පහත සඳහන් රජයේ සහ පෞද්ගලික ආයතන ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතියට සම්බන්ධ කිරීමට නිර්දේශ කෙරේ.
    - ➢ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
    - ➢ ලංකා බැංකුව
    - ➢ මහජන බැංකුව
    - ➢ පුද්ගලික බැංකු
    - ➢ පුද්ගලික රෝහල්
    - ➢ ජාත්‍යන්තර පාසල්
    - ➢ නීති සමාගම්

- පුද්ගලයකු රටින් පිටවීමේදී අදාල තැනැත්තා විසින් බදු ගෙවා ඇත්තේ කෙසේද යන්න  නිරීක්ෂණය කිරීම සඳහා ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතිය සමඟ ගුවන් තොටුපළ අන්තර් සම්බන්ධ කිරීමට නිර්දේශ කෙරේ.

- ඒකීය ඩිජිටල් අනන්‍යතාවය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන තුරු මෙම සියලු ආයතන විසින්  ජාතික හැඳුනුම්පත් අංකය ඒකීය හඳුනාගැනීමේ අංකය ලෙස භාවිත කිරීමට නිර්දේශ කෙරේ.

- ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතියේ පසු මෙහෙයුම් කාර්යාලය ක්‍රියාත්මක කිරීමට සහ එය පවත්වාගෙන යාමට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතිය (PPP) සලකා බැලීමට නිර්දේශ කෙරේ.

- අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ දත්ත හුවමාරු කර ගැනීමට හැකි වන පරිදි අදාළ නීතිමය සංශෝධනය සිදු කිරීමට රාජ්‍ය ආයතන වහා පියවර ගැනීමට නිර්දේශ කෙරේ.

- රාජ්‍ය ආයතනවල තොරතුරු තාක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන විට, අනෙකුත් රාජ්‍ය ආයතනවල තොරතුරු තාක්ෂණ පද්ධති සමඟ ඒකාබද්ධ කිරීමට හැකි වන ප්‍රතිපාදන සහිතව තොරතුරු තාක්ෂණ පද්ධතියේ තාක්ෂණික හැකියාව සහතික කිරීමට ජනාධිපති ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට නිර්දේශ කෙරේ.

- අවම වශයෙන් දැනට රාජ්‍ය ආයතනවල පවතින තොරතුරු තාක්ෂණ පද්ධති නවීකරණය හෝ යාවත්කාලීන කර 2024 වර්ෂයේ මුල් කාර්තුව තුළ 2016 වර්ෂයේ සිට යෝජනා වී ඇති ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.

## සමාජ සේවා වැඩසටහන් සහ සමාජ ආරක්ෂණ ජාලය

### පසුබිම

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 124 (3) (උ) අනුව, රජයේ සියලුම විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය උපස්ථානය, සුභසාධන හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම, ඒවායේ ගෙවීම් සහ ප්‍රතිපත්ති, ළමා ආරක්ෂණ වැඩසටහන්, ශාරීරික හෝ මානසික ආබාධ සහිත තැනැත්තන් සඳහා වන වැඩසටහන්, පුනරුත්ථාපන වැඩසටහන් ඇතුළු රජයේ සමාජ සේවා වැඩසටහන් ආශ්‍රිත කරුණු විමර්ශනය කර නිර්දේශ ලබාදීමට කාරක සභාවට බලය ඇත.

කාරක සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව රජය විසින් හඳුන්වා දුන් අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ ක්‍රමය හා රජයේ වෙනත් සුභසාධක හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලදී.

2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත මඟින් ලබා දී ඇති බලතල අනුව 2023.04.21 දිනැති අංක 2328/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අස්වැසුම ප්‍රතිලාභීන් ලෙස පවුල් මිලියන දෙකක් සහ පුද්ගලයන් 446,000 ක් හඳුනාගෙන ඇත.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද 2022 වසරේ දත්තවලට අනුව වයස අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටි ජනගහනය 1051000 ක් වේ.

ප්‍රතිලාභීන් 72000 කට ආසන්න සංඛ්‍යාවකට ආබාධිත දීමනාව ලෙස මසකට රුපියල් 5000/= ක් ලැබේ.

**නිරීක්ෂණ**

කාරක සභාව විසින් පහත කරුණු නිරීක්ෂණය කළේය.

- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව, සෑම වසර 3 කට වරක් ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයක් (HIES) පැවැත්විය යුතු වුවද, ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය අවසන් වරට පවත්වන ලද්දේ 2019 වර්ෂයේදී ය.

- ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2022 වර්ෂයේදී පවත්වන ලද්දේ නම්, වත්මන් ආර්ථික අර්බුදයේ බලපෑම නිසි පරිදි විශ්ලේෂණය කිරීමට 2019 සහ 2022 දත්ත සංසන්දනය කිරීමට ඉඩ තිබුණි.

- ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය වසර 2022 දී නොපැවැත්වීම නිසා බලධාරීන්ට ශ්‍රී ලංකාව පිළිබඳ සංඛ්‍යාලේඛන ලබා ගැනීමේදී ලෝක බැංකු වාර්තාවේ සංඛ්‍යාලේඛන මත රඳා පැවතීමට සිදුවේ.

- රජය සුභසාධක ප්‍රතිලාභ සඳහා දළ දේශීය නිෂ්පාදනයෙන් 0.6%ක් 2023 අයවැයෙන් වෙන් කර ඇත.

- ශ්‍රී ලංකාව තුළ පවුල් සහ අනු පවුල් මිලියන 6ක් සිටින අතර එයින් 40%ක් දළ වශයෙන් මිලියන 2.8 ක් ලෙස ගෙන පවුල, ඒකකයක් ලෙස සැලකීම ප්‍රතිලාභ ලැබිය යුත්තන් ගණනය කිරීමට සුදුසුම ක්‍රමය වේ.

- අස්වැසුම ප්‍රතිලාභීන් සමෘද්ධි දෙපාර්තමේන්තුව මගින් සවිබල ගන්වනු ලබන අතර සමෘද්ධි දෙපාර්තමේන්තුව, ආසියානු සංවර්ධන බැංකුව සහ කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ සහයෝගයෙන් අස්වැසුම ගෙවීම් යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කෙරේ.

- දෘශ්‍යාබාධිත පිරිස විසින් බැංකු ගිණුම් ආරම්භ කිරීමේදී විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙනු ලැබේ.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බැංකු වෙත නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය සහ විධානවල, විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ට පහසුකම් සැලසීමට, බැංකුවලදී ඔවුන්ට සාමාන්‍ය පුද්ගලයන්ට සමානව සැලකීමට සහ ඔවුන්ට බැංකු ගනුදෙනු පහසුවෙන් සිදු කිරීමට හැකි වන ලෙස පද්ධති නවීකරණයන් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් අඩංගු වේ. මේ සඳහා බැංකු කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව සහ පහසුකම් ලබා දී ඇත. මෙම ආයතන එම නියෝගවලට අනුගත නොවන්නේ නම් වැරදිකරුවන්ට එරෙහිව පියවර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ඇත.

- අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ
    - ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව -3,500,000
    - ඉදිරියට කටයුතු කිරීමට තෝරාගත් අයදුම්පත් සංඛ්‍යාව - 1,792,000
    - දැනටමත් තෝරාගෙන ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව-800,000
    - ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව - 1,024,000
    - ලැබී ඇති විරෝධතා සංඛ්‍යාව-124,000

- 1,200,000 ක් පමණ වන දිළිඳු හා අන්ත දිළිඳු පුද්ගලයන් / පවුල් සංඛ්‍යාවක් අස්වැසුම සුබසාධක ප්‍රතිලාභය ලබති.

- වෙනස් හැකියාවන් ඇති තැනැත්තන් 72,000 ක් වකුගඩු රෝගීන් 39,150 ක්ද වැඩිහිටි පුද්ගලයින් 416,667 ක්ද වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්, හඳුනා නොගත් වකුගඩු රෝගීන් (CKDU) සහ වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් සඳහා ගෙවීම් යටතේ ප්‍රතිලාභ ලබති.

- වෙනස් හැකියාවන් සහිත පුද්ගලයින්, හඳුනා නොගත් වකුගඩු රෝගීන් (CKDU) සහ වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් සඳහා වන ගෙවීම් හැර පුද්ගලයින් 2,000,000 කට ප්‍රතිලාභ ලබා දීමට මූල්‍යමය ප්‍රතිපාදන ඇත.

- අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ වගකීම් පැවරී ඇති වගකිවයුතු රාජ්‍ය නිලධාරියකු නොමැත.

- ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දත්ත රැස් කිරීමට සිදු කරන ලද සමීක්ෂණයට සමෘද්ධි නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් සහභාගි වී නොතිබුණි.

- අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනා විභාග කිරීම සඳහා අභියාචනා මණ්ඩල පත් කර ඇත. අභියාචනාවල සඳහන් තොරතුරු සත්‍යාපනය කිරීමට ග්‍රාම නිලධාරීන්ගේ සේවය අත්‍යවශ්‍ය වේ.

- ග්‍රාම නිලධාරීන්ට අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ ක්‍රමය යටතේ රාජකාරි කිරීමට නිසි බලය ලැබී තිබුණේ නැත. 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 21 වැනි වගන්තිය යටතේ පැනවිය හැකි දඬුවම්වලට යටත් විය හැකි බැවින් සහ ග්‍රාම නිලධාරීන්ට සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් කටයුතු නොකිරීම හේතුවෙන් ග්‍රාම නිලධාරීවරු මෙම ක්‍රියාවලියට සම්බන්ධ වීමට මැලිකමක් දක්වති.

- දත්ත සත්‍යාපනය කිරීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවට, ලංකා විදුලිබල මණ්ඩලයට සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළ සබැඳි අභියාචනා මණ්ඩල වෙත ලබා දී තිබුණි.

- පවුල් 1,700,000ක් සඳහා සමෘද්ධි දීමනා ගෙවා තිබූ අතර එයින් පවුල් 800,000 ක් දැනටමත් අස්වැසුම සඳහා සුදුසුකම් ලබා තිබේ.

- කොවිඩ් වසංගතය හේතුවෙන් තම ජීවනෝපාය අහිමි වූ පුද්ගලයින් අස්වැසුම ප්‍රතිලාභීන් ලෙස ඇතුළත් කර නොමැත.

- 2023.02.21 දිනැතිව 2002 අංක 24 දරන දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නිකුත් කරන ලද (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ II උපලේඛනයේ දක්වා ඇති වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන්, හඳුනා නොගත් වකුගඩු රෝගීන් (CKDU) සහ වයස්ගත ප්‍රතිලාභීන් සඳහා වන ගෙවීම් 2023 අප්‍රේල් සිට අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය යටතේ අත්හිටුවා තිබුණි.

- අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වාදීමට පෙර මෙම දීමනා ලැබූ 527,817ක් වූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව සඳහා 2023 ජූලි මාසයේ සිට මෙම ගෙවීම් සිදු කෙරේ.

- රට තුළ දෘශ්‍යාබාධිත පුද්ගලයන් 400,000 කට අධික සංඛ්‍යාවක් සිටිති.

- ජාතික හැඳුනුම්පත නොමැති 62,632 දෙනෙකු අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබා සිටිති. ශුන්‍ය තැන්පතු පදනම යටතේ ජාතික හැඳුනුම්පත නොමැති අස්වැසුම සුබසාධක ප්‍රතිලාභීන්ට බැංකු ගිණුම් විවෘත කිරීමට පහසුකම් සලසන ලෙස සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීමක් කර තිබුණි.

- අස්වැසුම ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා සමෘද්ධි නිලධාරීන් යෙදවීමට යෝජනා කර ඇත.

## නිර්දේශ

- ආර්ථික අර්බුදය තුළ ප්‍රතිපත්ති සම්පාදනය, දරිද්‍රතා විශ්ලේෂණය සහ සමාජ-ආර්ථික සැලසුම්කරණය සඳහා ප්‍රයෝජනවත් වන ගෘහස්ථ ආදායම්, වියදම් සහ ජනතාවගේ ජීවන තත්ත්වය පිළිබඳ වටිනා තොරතුරු සපයන බැවින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය (HIES) වහාම පැවැත්විය යුතු යැයි නිර්දේශ කෙරේ.

- අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම විවෘත, විනිවිදභාවයෙන් යුතු හා දේශපාලනික නොවන ක්‍රමවේදයක් හරහා සිදු කිරීමට නිර්දේශ කෙරේ.

- අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සෑම වසරකම සමාලෝචනයට ලක් වන බව ප්‍රතිලාභීන්ට සහ සියලුම පුරවැසියන්ට දැනගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් කිරීමට නිර්දේශ කෙරේ.

- කාර්මික සංවර්ධන මණ්ඩලය, බැංකු සහ විදාතා මධ්‍යස්ථාන සමඟ එක්ව අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

- පොහොර සහනාධාරය සහ ගැබිනි මව්වරුන් සඳහා දීමනාව වැනි අනෙකුත් සහනාධාර ජාතික හැඳුනුම්පත් අංකය මඟින් නිශ්චිත පුද්ගලයා හඳුනා ගන්නා විධිමත් සමාජ ආරක්ෂණ ලේඛනයක් යටතට ගෙන ආ යුතු යැයි නිර්දේශ කෙරේ.

- දෘෂ්‍යාබාධිත පිරිස් සඳහා බැංකු කටයුතු පවත්වා ගෙන යාමේදී මුහුණ දෙන දුෂ්කරතා තුරන් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දීමට නිර්දේශ කෙරේ.

- නාගරික යාචකයින් පුනරුත්ථාපනය කිරීමේ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන අතර වාණිජකරණය වූ ව්‍යාජ යාචකයන්ගෙන් සැබෑ නාගරික යාචකයින් වෙන්කර හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු යැයිද ශ්‍රී ලංකාවේ නාගරික යාචකයින් පිළිබඳ සංගණනයක් පැවැත්වීමට ද නිර්දේශ කෙරේ.

- ග්‍රාම නිලධාරීන් සමඟ සාකච්ඡා කර වැටුප් පරිමාණය තීරණය කිරීමෙන් පසු ග්‍රාම නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව සකසා අවසන් කරන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට දැනුම් දීමට නිර්දේශ කෙරේ.

- අස්වැසුම අභියාචනා මණ්ඩලවලට අදාළ රාජකාරී කටයුතු සිදුකිරීම සඳහා ග්‍රාම නිලධාරීන්ට බලය පැවරීමේ ලිපියක් නිකුත් කිරීමට නිර්දේශ කෙරේ.

- 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 21 වැනි වගන්තිය යටතේ දඬුවම් පැනවීමට අදාළ විධිවිධාන බලාත්මක නොකිරීමට පියවර ගැනීමට නිර්දේශ කෙරේ.

- අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු රාජ්‍ය නිලධාරීන් කාණ්ඩයක් පත් කිරීමට නිර්දේශ කෙරේ.

- නිවාස හිමියන් පිළිබඳ මාර්ගගත දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීමට සහ මෙම දත්ත සමුදාය හරහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට අවශ්‍ය දත්ත ලබා ගැනීමට නිර්දේශ කෙරේ.

- ජාතික හැඳුනුම්පත් නොමැති අස්වැසුම සුබසාධක ප්‍රතිලාභීන් සඳහා මාස හයක කාලයක් තුළ ජාතික හැඳුනුම්පත ලබාදීමට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් කටයුතු සම්පාදනය කිරීමට නිර්දේශ කෙරේ.

# හදිසි ආපදා සහන

**පසුබිම**

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 124(3)(ඌ) ප්‍රකාරව, හදිසි ආපදා සහන සැපයීම සහ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධ කරුණු පිළිබඳව විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවට බලය පැවරී ඇත.

හදිසි සහන සැපයීම පිළිබඳ ආයතනික රාමුවට මූලික වශයෙන්ම ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක් සම්බන්ධීකරණය කිරීම ඇතුළත් වේ. ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු ජනාධිපතුමාගේ සභාපතීත්වයෙන් යුතු ඉහළම මට්ටමේ අධීක්ෂණ ආයතනය ලෙස පිහිටුවා ඇති අතර, හදිසි සහන සැපයීමට සහ ආපදා කළමනාකරණයට අදාළ මෙහෙයුම් සිදුකිරීමේ ආයතනය ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී. අවදානමට ලක්විය හැකි ජන කොටස් සඳහා හානි අවම කිරීම, ආපදා පෙර සූදානම් ක්‍රියාකාරකම් සිදු කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම යන කාර්යයන් ඉටු කිරීමේ බලය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති අතර, ආපදා සහන සේවා මධ්‍යස්ථානය හදිසි සහන සැපයීම කළමනාකරණය කිරීම සහ ජීවිතාරක්ෂක කටයුතු සඳහා ත්‍රිවිධ හමුදාව සංවිධානය කිරීම සිදු කරයි. 2023 වර්ෂයේ අයවැය මගින් ආපදා සහන සේවා මධ්‍යස්ථානයට රු. මිලියන 1,578 ක ප්‍රතිපාදන වෙන් කර තිබේ.

2023 මැයි මාසයේ සිට ජූලි මාසය දක්වා වන කාලය තුළ ENSO - මධ්‍යස්ථ තත්ත්වයන් අඛණ්ඩව පැවතීමේ හැකියාව 40% ක මට්මක පවතින බවත්, 2023 මැයි මාසයේ සිට ජූලි මාසය දක්වා කාලය තුළ ENSO මධ්‍යස්ථ තත්ත්වයේ සිට එල්නිනෝ (El-Niño) තත්ත්වය දක්වා වෙනස් වීමේ හැකියාව 60% ක මට්ටමක පවතින බවත් ලෝක කාලගුණ විද්‍යා සංවිධානය (WMO) පුරෝකථනය කරයි. එල්-නිනෝ තත්ත්වය නිසා ජල විදුලි උත්පාදනයට සහ ගොවිතැන් කටයුතුවලට බාධාකාරී වන දීර්ඝ කාලීන නියඟ ඇති විය හැකි අතර, එබැවින් එල්-නිනෝ තත්ත්වය වර්ෂාපතනය අඩුවීම කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකිරීමට හේතු විය හැක. 2023 ජූනි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ ධන ඉන්දියානු සාගර ද්වි-ධ්‍රැව (IOD) තත්ත්වයක් වර්ධනයවීමේ හැකියාව පවතින බව ගෝලීය දේශගුණික ආකෘති බොහොමයක් මගින් පුරෝකථනය කර ඇත. ධන ඉන්දියානු සාගර ද්වි-ධ්‍රැව තත්ත්වයක් මගින් ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රදේශවලට නිරිතදිග මෝසම මගින් වර්ෂාපතනය ලැබීම වැළැක්විය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අධ්‍යයන වලින් පෙන්වා දෙයි. එල්-නිනෝ තත්ත්වය සහ ධන ඉන්දියානු සාගර ද්වි-ධ්‍රැව තත්ත්වය යන දෙකම මගින් නිරිතදිග මෝසම් සමයේ දී රටේ මධ්‍යම ප්‍රදේශවලට වර්ෂාපතනය ලැබීම වළක්වයි. කෙසේ වෙතත්, බෙංගාල බොක්ක ප්‍රදේශය ආශ්‍රිතව අඩු පීඩන පද්ධති, පීඩන අවපාත හෝ සුළි කුණාටු වර්ධනය වීමේ හැකියාවක් පවතින බැවින් එය රට පුරා වර්ෂාපතනය වැඩිවීමට හේතු විය හැක.

නිරිතදිග මෝසම සහ ඊසානදිග මෝසම යන ප්‍රධාන මෝසම් කාල දෙක රටේ වර්ෂාපතන රටාවට සහ දේශගුණයට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. සෑම මෝසම් කාලයකටම පෙර සියලු ම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඇතිව මෝසම් සංසදයක් (Monsoon Forum) පවත්වනු ලබන අතර, ඒ අනුව නිරිතදිග මෝසම පිළිබඳව දැනුවත් කිරීම පිණිස මෙම සංසදය පවත්වන ලදී. එම සංසදයේ දී ලබා ගත් තොරතුරු පදනම් කර ගෙන පාර්ශවකරුවන්ට ඔවුන්ගේ කටයුතු සැලසුම් කර ගත හැක.

**නිරීක්ෂණ**

කාරක සභාව විසින් පහත කරුණු නිරීක්ෂණය කළේය.

- ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව අවසන් වරට රැස්වී තිබුණේ 2013 වර්ෂයේ දී වන අතර, ඒ අනුව එම සභාව දශකයකට ආසන්න කාලයක් රැස්වී නොමැත.

- ආපදාවක් සිදුවීමෙන් අනතුරුව ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව රැස්වීමෙහි ප්‍රයෝජනයක් නොමැති අතර, එම සභාව රැස්විය යුත්තේ ආපදාවක් සඳහා පෙර සූදානම සාකච්ඡා කිරීම පිණිස සහ ආපදාවන් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස ය.

- මෙම වර්ෂය තුළ මෙතෙක් ආපදාවක් සිදුවී නොමැති බැවින් 2023 වර්ෂයේ අයවැය මගින් වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන සහන සේවා සැපයීම සඳහා වියදම් කර නොමැති අතර, කෙසේ වෙතත් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරන ලද ආපදා පෙර සූදානම් ව්‍යාපෘති සඳහා එම මුදල් වැය කර ඇත.

- ජල විදුලි උත්පාදනයට සහ ගොවිතැන් කටයුතුවලට අහිතකර බලපෑම් ඇති කළ හැකි එල්-නිනෝ තත්ත්වයෙහි සහ ධන ඉන්දියන් සාගර ද්වි-ධ්‍රැව තත්ත්වයෙහි බලපෑම අවම කිරීම සඳහා පෙර සූදානම් ක්‍රියාමාර්ග හෝ බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නැත.

- ආපදා අවදානම් අවම කිරීමේ කාර්යයන්හි නිරතව සිටින පාර්ශ්වකාර ආයතන සහ ආපදා සහන සැලසීමේ කටයුතුවල නිරත වන පාර්ශ්වකාර ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නැත.

- තම පාරම්පරික ඉඩම්, ජීවනෝපාය සහ ස්වභාවික පරිසරය අතහැර දැමීමට ඇතැමුන් දක්වන මැලිකම හේතුවෙන් ආපදාවකදී රටේ ඇතැම් ප්‍රදේශවල පුද්ගලයින් ඉවත් කිරීමේ කටයුතු දුෂ්කර වී තිබේ.

- ස්වාභාවික ආපදාවලින් ඇතිවිය හැකි හානි සඳහා දිවයිනේ සියලු ම නිවාස රක්ෂණය කිරීම පිණිස 2016 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද රක්ෂණ ක්‍රමය මුදල් අමාත්‍යාංශය විසින් මූල්‍යමය කාරණා හේතුවෙන් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මඟින් 2020 වර්ෂයේ දී නවත්වා ඇත.

- හදිසි සහන සැපයීම වෙනුවෙන් ලැබෙන පරිත්‍යාග සඳහා එකතු කළ අගය මත බද්ද (වැට්) සහ සෙස් බද්ද පනවා ඇත.

**නිර්දේශ**

- ආපදා කළමනාකරණය සඳහා අදාළ රාජ්‍ය නිලධාරීන්ගෙන් සැදුම්ලත් ප්‍රධාන කණ්ඩායමක් (Core Group) පිහිටුවීමට නිර්දේශ කෙරේ. එම කණ්ඩායමට ආපදා කළමනාකරණය කිරීම පිණිස ආපදාවලින් සිදුවන බලපෑම් අවම කිරීමේ සැලසුම් සකස් කර සාකච්ඡා කළ හැක.

- අදාළ රාජ්‍ය ආයතන විසින් පරිසර අමාත්‍යාංශය විසින් සකස් කරනු ලබන ආපදාවලින් සිදුවන බලපෑම් අවම කිරීමේ සැලැස්මට සහ අනුවර්තනය වීමේ සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු බවට නිර්දේශ කෙරේ.

- ජලවිදුලි බලය උත්පාදනය කිරීමට සහ කෘෂිකර්මාන්තයට බලපාන දීර්ඝ කාලීන නියඟයක් ඇතිකළ හැකි බවට පුරෝකථනය කර ඇති එල්-නිනෝ තත්ත්වයෙහි බලපෑම අවම කිරීමේ ක්‍රියාමාර්ග සහ ඒ සඳහා පෙර සූදානම සාකච්ඡා කිරීම පිණිස අදාල පාර්ශවකරුවන්ගේ රැස්වීම් කැඳවීමට නිර්දේශ කෙරේ.

- මූල්‍ය හා පරිපාලන තීරණ ගැනීමේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට මුහුණ දීමට සිදු වන දුෂ්කරතා මගහරවා ගැනීම පිණිස සහ ගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සඳහා ඇති දුෂ්කරතා මගහරවා ගැනීම පිණිස 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමට නිර්දේශ කෙරේ.

- කළුගඟ පිටාර ගැලීම හේතුවෙන් සෑම වර්ෂයකදීම රත්නපුර දිස්ත්‍රික්කයට ගංවතුර තත්ත්වයන් ඇති වන බැවින් කළුගඟ පිටාර ගැලීමෙන් ගංවතුර ඇතිවීමේ ගැටළුවට වහා විසඳුම් ලබා දීමට නිර්දේශ කෙරේ.